භක්ති ප්‍රබෝධනය
පවුලේ සඟරාව

# භක්ති ප්‍රබෝධනය

සියවසක් ඉක්මවූ නොනවතින යුග මෙහෙවර

2022 මැයි - ජුනි | 123 වන කාණ්ඩය - 04 කලාපය | පිටු 32 | QD/NEWS/09/2022



# මිහි මඬලේ....

පද රචනය - ඩබ්. ඒ. අබේසිංහ
තනු නිර්මාණය - ආචාර්ය නන්දා මාලනී
ගායනය - ආචාර්ය නන්දා මාලනී

මිහි මඬලේ අඳුරු කුසේ
දිය උල්පත අම්මා
අහස් තලෙන් මරු කතරට
වහින වැස්ස අම්මා
නිල් දෙරණේ තුරුලිය මත
මල් සම්පත අම්මා
තුරුලිය මත පිපි කුසුමේ
එල සම්පත අම්මා

සිය දහසක් නෙක ලෝදා
එළිය කරන අම්මා
සොළොස් කලා පිරි පුරහඳ
එළිය කරන අම්මා

සඳ නැති රෑ සක්වල තරු
එළිය කරන අම්මා
උදා ගිරෙන් ලොවට වඩින
ළහිරු මඬල අම්මා



අම්මා නම් වූ උත්තමාවියට සම කළ හැකි කිසිවෙක් හෝ කිසිවක් මෙලොව වේ නම්, ඒ සොබා දහම් මාතාව පමණකි. ආචාර්ය ඩබ්ලිව්. ඒ. අබේසිංහ ගේය පද රචකයාණන්ගේ විශිෂ්ට ගී පදවලින් හැඩ වූ "මිහි මඬලේ අඳුරු කුසේ" ගීතය අපට ගෙන හැර පාන්නේ ඒ සත්‍යය යි.

දරුවකු බිහිකරන්නට පෙර, නෙක දුක් දරමින් සිය දරු ගැබ සුරකින අම්මා, වැසි වස්වන්නට පෙර මහා දිය කඳක් දරා සිටින අඳුරු වලාවක් හා සමානය. එහෙත් ඒ වසින වැස්සෙන්, කාන්තාරයක් පවා නිල් දෙරණක් වී තුරුලිය මත කුසුම් පිපෙන්නා සේ, අම්මා කෙනකුගේ අසමසම කැපවීම අවසාන මල් එල දරයි. එබැවින්, "අහස් තලෙන් මරු කතරට වහින වැස්ස" ද අම්මා මය.

අඳුරු රැයක් එළිය කරන්නේ පුරහඳ වේ. එනමුදු ඒ පුරහඳ පවා එළිය කරන්නට සමත් කවුරුන් හෝ වේද, අම්මා ද ඒ තරමටම ලොවට එළිය බෙදන්නීය. මොහොතකට, රචකයා "පුරහඳ" යැයි හඳුන්වන්නේ පවුලක පිය චරිතය බැව් අර්ථකථනය කර ගනිමු. පියා නොමැති පවුලක් "සඳ නැති රැයක්"සේ නම්, ඒ රැයේ පවා සිය දරුවන් නම් වූ "සක්වල තරු" එළිය කරන හිරු, අම්මා වේ.

නන්දා මාලනිය මේ සුවිශේෂී ගීතය සඳහා දායක වන්නේ සිය ප්‍රබල හඬ පෞරුෂයෙන් පමණක් නොවේ. ඒ හැඟුම්බර තනුව සහ සංගීතය ද එතුමියගේම වේ. "මිහි මඬලේ අඳුරු කුසේ" ගීතය මව් සෙනෙහස ලියැවුණු ගීත අතර නොමැකෙන සලකුණක් වන්නට එයද හේතුපාදක වේ.

ගරු ශානිල් දිනුක ජයවර්ධන නි. ම. නි. පියතුමා

# ශක්ති ප්‍රබෝධනය

2022 මැයි - ජූනි

**ප්‍රකාශනය**

නිර්මල මරිය නිකාය

**භාරකරු**

අතිගරු රොෂාන් සිල්වා නි.ම.නි. පියතුමා
නිර්මල මරිය නිකායික ප්‍රාදේශාධිපති
කොළඹ ප්‍රාදේශිකය

**සංස්කාරක**

ගරු එමාඩ් දල්පතාදු නි.ම.නි. පියතුමා

**සංස්කරණ සහාය**

රූපස් ප්‍රැන්සිස්
ටී. සුනිල් ප්‍රනාන්දු
ෆිලීෂන් අබයකෝන්

**මුද්‍රණ සැලසුම හා කවර නිර්මාණය**

අචල රූපසිංහ

**මුද්‍රණය**

කතෝලික මුද්‍රණාලය
කොළඹ 08.

## පිටුවෙන් පිටුව..........


2 කවරයේ කථාව
3 හෙළිදරව්ව
4 දිගු ආසිරි....
- තියෝබෝල්ඩ් සමරතුංග
5 ස්වෛරීත්වය....
- වෛද්‍ය සචිත මිලින්ද මෙන්ඩිස්
6 වැදූ මව පසුකරයි.... - සුමීර ගුණසේකර
8 මවක් වන්නේ.... - මහින්ද නාමල්
9 මව් පදවිය - ෆිලීෂන් අබයකෝන්
10 මෙන්න ඔබේ මෑණියෝ - ෂෙල්ටන් සමරසිංහ
11 විදු මවුනි.... - අමාශා තිලකරත්න
12 Mother Lanka and Democracy - K. C. Grero
13 විමසීම - සපුගස්කන්දේ රංජිත්
14 සියවස සපුරන.... - බෙනී ජයමාන්න
16 ගුරු මෑණියෝ - රූබි රුදිගු
18 සොබාදම් මාතාව
- ගරු රොෂෙල් ගුරුසිංහ පියතුමා
20 ඕං එහෙනං - ජෝසප් ඩයස්
21 අමිතගේ හද ගැස්ම - සී. අමිත
චුට්ටා
- ගරු තිලකසිරි ප්‍රනාන්දු පැ. තු. නි. පියතුමා
22 පුංචි විකුම් - සූරිය මාමා
23 මිහි මඬලෙත්.... - බුද්ධික සඳරුවන්
24 මවක නොවන මවක් - ආශා සෙව්වන්දි
27 මාරිස් ස්ටෙලා විදුහලට වසර සියය....
- ගරු චාමර හෙට්ටිආරච්චි සහෝදරතුමා
28 ප්‍රහේලිකා අංක - 67
- ගරු චාමික සුදර්ශන නි. ම. නි. පියතුමා
29 මොනවද අම්මේ අකුරු ජාතියක්
- ගරු එමාඩ් දල්පතාදු නි. ම. නි. පියතුමා
30 ඔබේ ගුණ කීමට....
- ගරු විලියම් ඉවාන්ස් ලියනාරච්චි පියතුමා
ප්‍රහේලිකා අංක 65 පිළිතුරු
32 අම්මා - බෙනඩික්ට් විජේසිංහ

වසර 1899 සිට අඛණ්ඩව
එළිදක්වන භක්ති ප්‍රබෝධනය
ශ්‍රී ලංකාවේ පළවන
ඉපැරණිම සිංහල සඟරාවයි.
භක්ති ප්‍රබෝධනය
නිර්මල මරිය නිකායේ
කොළඹ ප්‍රාදේශිකයේ
භාරකාරත්වය යටතේ
පළවන ප්‍රකාශනයකි.
(නි.ම.නි.)

Bhakthi Prabodhanaya,
Published continuously
since 1899, is the oldest
Sinhala magazine
in Sri Lanka.
Bhakthi Prabodhanaya,
is owned and published by
the Colombo Province of the
Oblates of Mary Immaculate.
(O.M.I.)




## කවරයේ කථාව

මහා පොළොව සියල්ල උසුලාගෙන දරාගෙන සිටින සේ "අම්මා" සියල්ල උසුලමින් දරාගෙන කොන්දේසි විරහිතව තම දරුවන්ගේ ශුභ සිද්ධිය උදෙසා ඇපකැප වන්නීය. ජීව විද්‍යාත්මක සම්බන්ධතාව තුළ බිහිවන අම්මා මෙන්ම දූ පුතුන් හදන අම්මා නොවන අම්මාද අපට මේ සමාජය තුළ හමුවේ. ඒ අතර දෙමව්පියන් අත්හැර දැමූ දූ දරුවන් වෙනුවෙන් තම පැවදි කැපවීම වඩාත් අර්ථවත් අයුරින් මෙහෙයවන මෙවන් අම්මාවරුන් කෘතවේදීව සිහිපත් කරමු. අත්හැර ගිය දූ දරුවන්ට සැබෑ "අම්මා" වූ ගරු බෙනිග්නස් සිල්වා දයාවේ පැවදි නිකායේ සොහොයුරියන්ගේ මවු සෙනෙහස ලබා එහි විශිෂ්ටත්ව යේ අත්දැකීම සමාජයට හඬ නගා කියන තරුණයකු, සුමීර ගුණසේකර. දේව මෑණියන්, සැබෑ අම්මාවරුන්, අම්මා නොවුණත් අම්මා, ගුරු මෑනිවරුන් මේ අකාරයට මව් පදවිය සුවඳ කරන අම්මාවරුන්ට උපහාරයක් ලෙස කවරයේ කථාව දිග හරිමු.

ගරු එමාඩ් දල්පතාදු නි. ම. නි. පියතුමා

## පාඨක හා බෙදාහැරීමේ නියෝජිත සැමගේ කාරුණික අවධානය පිණිසයි

කඩදාසිවල මිල ගණන් ක්ෂණිකව අධික ලෙස ඉහළයාම හේතුවෙන් සඟරාවේ මුද්‍රණ ගාස්තුද ඉතා ඉහළ අගයකින් වැඩිවීමකට භාජනය වී ඇත. මෙය හදිසියේ ඇතිවූ තත්ත්වයක් බැවින් ඒ පිළිබඳව කල් ඇතිව පාඨක ඔබව දැනුවත් කිරීමට නොහැකි වීම ගැන කණගාටු වෙමු.

ඒ අනුව, රටේ පවතින ඩොලර් අර්බුධය කඩදාසි කර්මාන්තයටද දැඩි බලපෑමක් කර ඇති අතර මේඅවස්ථාවේදී භක්ති ප්‍රබෝධනය සඟරාවේ මිල රු. 50/= කින් ඉහළ නංවන්නට සිදුවන බව අකැමැත්තෙන් හෝ පැවසිය යුතුය. එබැවින් සඟරාවක නව මිල රු. 100/= ක් ලෙස සලකන මෙන් කාරුණිකව ඉල්ලා සිටිමු.

වර්තමානයේ පවතින තත්ත්වය තුළ මේ මිළද සහනදායි මිලක් ලෙස පවසන්නේ, එක් සඟරාවක් සඳහා රු. 150 ක පමණ මුදලක් අපට වැයකිරීමට සිදුවූ බව ඔබගේ අවධානයට යොමු කිරීමටද කැමැත්තෙමු.

සංස්කාරක පියතුමා.
"භක්ති ප්‍රබෝධනය"

දුරකතන : 0112 698 177
විද්‍යුත් තැපැල : bhakthi.prabodhanaya@gmail.com

265, ඩීන්ස් පාර, මරදාන,
කොළඹ 10.

# අම්මා හෙළිදරව්ව

ජීවිතය ආරම්භ වන්නේ "අම්මා" ගෙන්ය. සොබාදහම තුළ ජීවිතයක් ජනිත වනුයේ අම්මා තුළය. ගහක, වැලක, මලක, ඵලයක, දිය උල්පතක, වහින වැස්සක, සතකු සහ මිනිසකු යන මේ සියලු ජීවී අජීව බොහෝ දෑ තුළ ගැබ්වී ඇති මාතෘත්වය ගැන අපි කතා කරමු. මව් ශාකය, මව් භාෂාව, මව් බිම, පාසැල් මාතාව, මව් නදිය ආදි අයුරින් අප ප්‍රකාශ කරන විට යමක හෝ ජීවයේ මුල් ආරම්භය උතුම් මව් පදවියට ආරෝපණය කර ඇත.

මත්ස්‍යයාගේ, පක්ෂියාගේ, සතා සිව්පාවාගේ මව් පදවිය තුළ පවා කිසියම් උත්තරීතර ලක්ෂණ කීපයක් හමුවේ. තම පැටවුනට ආදරයෙන් උපතේ පටන් ආරක්ෂාව දෙමින් තම ජීවිතය පවා පරිත්‍යාග කරන්නට පැටවුන් වෙනුවෙන් ඉදිරිපත් වන අම්මාවරුන් සත්ත්ව ලෝකයේ අපට දැක ගත හැකිය.

මිනිස් අම්මා කෙනකු හට සත්ව ලෝකයේ අම්මාවරුන්ගේ යහපත් ගතිපැවතුම් අබිබවා ගොස් දේව ගතිගුණ තිබෙන අයුරුද දැක ගත හැකිය. තම දරුවනට ජීවිතය දී එතැනින් නොනැවතී දරුවන්ගේ දිශාන්තය, තීරණය කරන්නට වෙහෙස මහන්සි වන ඔවුන් අතර කීර කොටු වවා, කලපුවට ගොස් ඉස්සන් අල්ලා, කළු ගල් කඩා, කඩයප්පම් හදා, පාරවල් අතුගා ගන්නා සොච්චම් වැටුපකින් දරුවන් සුපුෂ්පිත කරන්නට වෙර දරන අම්මාවරුන් ඕනෑතරම් මේ සමාජයේ දක්නට ඇත. තම කාලය, ශ්‍රමය, මුදල්, දරුවන් වෙනුවෙන් පමණක් නොව දරුවන්ගේ දරුවන් වෙනුවෙනුත් පූජා කරන සැබෑ අම්මාවරු, තම වචනයෙන් පමණක් නොව ජීවිත ක්‍රියාකලාපයෙන්ද, දරුවන් යහමග යවන්නට පණ නල තිබෙන තුරු වෙහෙසවීම නිරායාසයෙන්ම ශ්‍රේෂ්ඨ පූර්වාදර්ශයක් සපයති.

යාබද ඉඩමකින් වැටෙන් රිංගා පුංචි බෙන්ජමින් දර කෝටු ටිකක් එකතුකොට දෑතින් බදාගෙන ගෙදර ගෙනාවේ අම්මාට ශක්තියක් දීමේ ජයග්‍රාහී සිතිනි. එහෙත් දර ඉපල් ටික අන් සතු බිමකින් රැස්කර ගත්තා යන්න මව දැනගත් විගස ඒ දර තිබූ තැනින් නැවත තැබීම මවගේ ඉල්ලීම විය. මේ කියන පුංචි බෙන්ජමින් දේව සේවක තෝමස් බෙන්ජමින් කුරේ නි. ම. නි. කාදිනල් හිමිපාණෝය. "සොරකම් නොකරව" යන මූලික පාඩම එතුමා ඉගෙන ගත්තේ එදා තම මෑණියන්ගෙන්ය. එමෙන්ම පුංචි සන්ධියේ ළමයකුගේ ගල්ලෑල්ල සොරාගෙන මව් වෙත ගිය දරුවා තරවටු කරනු වෙනුවට මවගේ පැසසීම නිසා මතු දිනයකදී ඔහු ලොකු සොරකු වී මරණ දණ්ඩනයට නියම වී යන ගමනේදී තම අම්මාගේ කණට කොඳුරා කන්පෙත්ත විකා කඩාගත් පුතකු පිළිබඳව ඊසොප්ගේ උපමා කතාවල සඳහන්ය.

දරුවකුට අම්මා දෙන්නේ ශරීරය පෝෂණය කරන්නට මව්කිරි පමණක් නොව මව් කුසයට ආ දිනයේ සිටම දරුවාට අවැසි සියල්ල ප්‍රදානය කරන්නේ අම්මාය. යහපත් පැවැත්ම, ගුණධර්ම, අධ්‍යාපනය, ආගමික විශ්වාසය, සමාජ ජීවිතය ආදි සියල්ල දැනුවත්ව හෝ නොදැනුවත්ව අම්මා විසින් දරුවාට ලබා දෙන්නීය. එනිසා වන්නට ඇති ක්‍රිස්ටි ලෙනාඩ් ගායනා කරන ගීතයක මෙලෙස සඳහන් වන්නේ.

"අම්මා කියා කියත හැකි එකම ළඳකටයි

මෙලොව අපි දැකපු දෙවි පෙම්බර මව තමයි"

මහාචාර්ය සුනිල් ආරියරත්නයන් පද රචනය කළ, සුනිල් එදිරිසිංහයන් ගායනා කරන "දෙවැනි බුදුන් ලෙස" ගීතයේ "දෙවැනි බුදුන් ලෙස ලොවම උවම් කළ ලොවක පිදුම් ලද ලොවට උතුම් ලද අම්මා" යයි පවසන්නේද ඒ

උතුම් මව් පදවිය ගැනමය.

එමෙන්ම බිරිඳකගේ කෙනෙහිලිකම් නිසා අතීත ආවර්ජනයකට ගමන් කරන අගනුවර ජීවත් වන සැමියකුගේ මනසේ ඇතිවන චිත්ත පීඩනය ගෙනහැර දක්වන අධිනීතිඥ රන් බණ්ඩා සෙනෙවිරත්නයන් පද රචනය කරන ගුණදාස කපුගේ ගායනා කරන "දවසක් පැල නැති හේනේ" ගීතය මවකගේ නොවියළෙන සෙනෙහස අප ඉදිරියේ චිත්ත රූප මැවෙන අයුරින් මතු කරයි.

"කොළඹ අහස කළුකරගෙන මූදු හුළඟ හඬලනකොට ඔටුන්න බිම දා දුවගෙන එන්නද එක පිම්මේ, මං එනතුරු ඉදිකඩ ළඟ ඉන්නවාද අම්මේ"

මව් පදවිය උත්තරීතරය, අසමසමය, ශුද්ධය. පවුලට, සමාජයට, රටට, ලෝකයට, බලපාන සැබෑ හිතකර පුරවැසියන් පුහුණු කරන තෝතැන්නේ මුල් ගුරු මෑණියෝ අම්මාය. එවැනි අම්මාවරුන්ගේ සුවඳ, පරිසරය පුරා පැතිර දරුවන්ගේ ජීවිතය පුරා සුවඳ කරයි. නොමියන මතක සටහන් තබමින් දරුවන් වෙනුවෙන්ම ජීවිත කැපකළ, පුද කළ අම්මාවරුන්ට අපගේ ගෞරවය භක්ති ප්‍රණාමය පුද කරමු.

වැදූ මව්වරු වීමට බැරි වුවත් හැදූ අම්මාවරුන් අප සමාජයේ සිටින අතර ජීව විද්‍යාත්මකව මවක් නොවුවද, වචනයේ පරිසමාප්ත අර්ථයෙන්ම ඔවුන් සැබෑ මෑණිවරුය.

"වදලා කුණු බක්කියෙ දමලා යන අම්මලාට කියලා දෙන්නද අම්මේ, වදනා අම්මලාද හදනා අම්මලාද පැහැදුවෙ අම්මා අරුතේ" නෙල්සන් වාස් ගයන ගීතයකින් කොටසකි ඒ. අවාසනාවකට දරුවන් නොමග යවන, තමන්ගේ සුව පහසුව සහ සැප පතා ජීවත්වන අනාචාරයේ හැසිරෙමින් කට හැරෙන හැරෙන අතට වචන රතිඤ්ඤා සේ පත්තු කරමින් දරුවන්ට ගින්දර දෙමින් මව් පදවිය හැල්ලු කර ඊට නිගාදෙන වැදූ අම්මලා වත්මන් සමාජයේ සිටිති.

කතෝලික සැදැහැවත් බැතිමතුනට මරියෝත්තමාවන් අම්මාවරුන්ගේ පූර්ව ආදර්ශයය. එතුමිය තම ජීවිත ආදර්ශය තුළින් අපට පෙන්වාදෙන කිතුනු වටිනාකම් රාශියකි. ඒ අතර එතුමිය දෙවියන් වහන්සේ තුළ තැබූවා වූ අචල විශ්වාසය, සරල චාම් ජීවිතය, නිහතමානකම, පිරිසිදුකම, ඉවසීම, බලාපොරොත්තුව සහ සියල්ල සිත්හි නිදන්කර ගනිමින් සංසුන්ව අභියෝග හමුවේ නොසැලී උපේක්ෂාවෙන් ජීවිතයට මුහුණ දුන් ආකාරය අම්මාවරුන්ට පමණක් නොව අම්මාවරුන් වන්නට ප්‍රාර්ථනා කරන දියණියන් ඇතුළු ක්‍රිස්තු අනුගාමිකයන්ට ආලෝකයකි. සඳ නැති රෑ සක්වළ තරු එළිය කරන්නා සේ දේව මෑණියෝ කිතුනු අපගේ දිවි ගමනේ උදය තාරකාවයි. උදය තාරකාවෙනි අප නිසා යාච්ඤා කළ මැනව.

**සංස්කාරක පියතුමා**

## භක්ති ප්‍රබෝධනයට පතමි දිගු ආසිරි

වසරේ එක්දහස් අටසිය අනූ නවය
බිහිවී වසර එකසිය විසිදෙක නිමය
ඒ තුළ කරන ලද සේවය මනහරය
දැ වස්තුවකි අපගේ බැති පොබ දනය

ගරු කර පියවරුන් හා බැඳි නිමනි
බිහි කළ සඟරාව වෙයි අති රමණී
කිතු බැති දනගෙ හැකියා මතුකර පෙමිනි
කර ඇති මෙහෙය වෙත තුති දෙමි මරි මවුනි

පාසැල් වියේ සිට බැති පොබ දන බැලුව
එයි මතකයට යටගිය තතු සිහි කෙරුව
යුග මෙහෙවරය සිතුවම ලෙස නෙත පිනුව
දිගු ආසිරිය පතනෙමි නිති හද පිරුව

**තියෝබෝල්ඩ් සමරතුංග**

# ස්වෛරීත්වය සහ මව්බිමේ ආර්ථිකය

මානව විමුක්තිය, ගර්භාශයේ දී හා ප්‍රසිද්ධ ජීවිතය වන තෙක්ම ශුද්ධාත්ම අනුභාවය ආරක්ෂා කර ලොවට ප්‍රසූත කළ ආදරණීය මරිමව් මෙන්, අප මාතෘභූමිය ද අපට මේ මහ පොළව මත ඇති මාතා ධරණී වෙයි. ශ්‍රී ලංකා මාතාව අද ඉහළ පෙළේ රතු නිවේදන ලැබෙන්නා වූ පතුලක් නොපෙනෙන දරුණු අගාධයකට වැටී ඇත. සිරිලංකා ඉල්ලංකා යන ආප්තයට සරිලෙස මේ වන විට ට්‍රිලියන 13 අධික ණය ලබාගෙන ඇති අප මාතෘභූමියේ, ට්‍රිලියන දෙකකට වඩා වැඩ කෙරී නැතිවීම විමතියට කරුණකි. ඉතිරි ට්‍රිලියන 11 ට සිදු වූ දේ කුමක් ද ? එය ගිල්ල බහිරවයෝ කවුද යන්න සොයා බැලිය යුතුය.

ප්‍රශ්නයේ ඇත්ත උපකල්පනය කළ හැකිය. සොරා කෑ මුදල් අපතේ ගොස් නැත. ඒවා ඩොලර් හෝ රත්රන් ලෙස ඉතා සටකපට ලෙස අදාල පුද්ගලයන්ගේ විදේශ බැංකු ගිණුම් හි තැන්පත් වී හමාරය. අධික පොලියට හා රටට නොගැලපෙන හා අන් රාජ්‍යවල සූක්ෂම න්‍යාය පත්‍රවලට ගැති වෙමින් ලබාගත් ණය අද හුදු ණයම පමණක් වී තිබේ. ඉන් සිදුවූ දෑනෙන ආයෝජනයක් නැත. මුදල් උත්පාදනයක් ද නොවේ. දළ ජාතික නිෂ්පාදනයෙන් ඉතියෝපියාව වඩා ඉහළින් සිටි අප 2020 වන විට ඉතියෝපියාවටද වඩා පහළට වැටුණ අතර අද වන විට එය ඩොලර් බිලියන හැත්තෑ ගණනකට සීමාවී ඇත. ආර්ථික විද්‍යා ගණනයට අනුව එය ඉතා පහළ සෘණ අගයකි.

විදේශ සංචිතවල ප්‍රමාණය පතුල පෙනෙන මානයට වැටී ඇත. වෙළඳ හිගය ඩොලර් මිලියන 10,000 ඉක්මවා ගොසිනි. බොරතෙල් නැතිව පිරිපහදු වැසී ඇත. පිරිපහදුවක වටිනාකම සිමෙන්ති නිෂ්පාදනයේ සිට ඉටිපන්දම් නිෂ්පාදනය දක්වා පරාසයක විහිදෙන කර්මාන්තයකි. දූවි තෙල් ද විදුලිබල උප්පාදනයට අත්‍යවශ්‍ය අතර ඒවා නැතිව රජයේ බලාගාර නැවතී ඇත. පෞද්ගලික ඩීසල් බලාගාරවලට මෙය ඉතා හොඳ ඉල්ලමක් වන අතර, හදිසි මිලදී ගැනීම් ද කඩිමුඩියේම සිදුවෙයි.

තවද අප රටේ විදේශ ප්‍රතිපත්තිය ඉතා නරක ස්ථානයක පසුවෙයි. ඉතා ඉහළ නොබැඳි ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කළ සිරිමාවෝ බණ්ඩාරනායක මැතිණිය 1975 දී ගත් යම් යම් වැරදි තීන්දු එවක රජයේ විනාශයට හේතුවිය. ඊට බලපෑවේ එස්. ඩබ්ලිව්. ආර්. ඩී. බණ්ඩාරනායක මහතාගේ ඥාති සොහොයුරකු වන තවත් බණ්ඩාරනායක කෙනකුම වන අතර ඔහු නිසා කොල්වින් ආර්. ද සිල්වා හා එන්. එම්. පෙරේරා තුන්හවුල් රජය හැර ගියෝය. ඉන් පසු පැවති මැතිවරණයෙන් බණ්ඩාරනායක මැතිණියට අන්ත පරාජයක අම්හිර විඳීමට සිදුවිය. අද ආර්ථිකය හසුරුවන සොහොයුරා මෙන් නොව ඔහු කොළඹ රාජකීය හා ලංකා විශ්ව විද්‍යාලයේ උගත් ලාංකික විශිෂ්ට නීතිඥයෙකි. අද අපේ ආර්ථිකය හසුරුවන සොහොයුරා අප රටවැසියකු නොව විදේශිකයකු වන අතර ගණිතය කෙසේ වෙතත් මූලික ආර්ථික විද්‍යා සංකල්පද නොදත් සොරකමටම කුසලාන දිනූ, මව්භාෂාව හෝ තමන් අවුරුදු තිහක් සිටි රටේ භාෂාවවත් නිසි ලෙස වැහැරීමේ හැකියාවක් නැති මාතෘභූමියේ ආර්ථික ඝාතකයාය යන සන්නාමයට හිමිකම් කියන්නෙකි.

අඳුරට සාප කරනවාට වඩා එක් පහනක් දල්වීම අගනේය. ආර්ථිකය හා ස්වෛරීභාවය යන දෙකම මේ අසීරු මොහොතේදී අප රැක ගත යුතුවෙයි. ඉන්දියාව, චීනය හෝ ඇමරිකා එක්සත් ජනපදය සමග එක්ව ඉතා කල්පනාවෙන් හා ශුද්ධ වූ අධ්‍යාත්මයක් සහිතව අප ඉදිරියට යා යුතුවෙයි. දේශපාලන සාක්ෂරතාව ඉතා අඩු එහෙත් අකුරු කියවීමේ හැකියාව 90% කට වඩා වැඩි අප රටට අවැසි වන්නේ හොඳ අධ්‍යාත්මයක් සහිත විචක්ෂණ බුද්ධියකින් යුත් නායකයෙකි. එවැන්නකු තවම

7 වන පිටුවට.....

**වෛද්‍ය සචිත මිලින්ද මෙන්ඩිස්**
ජ්‍යෙෂ්ඨ වෛද්‍ය නිලධාරී උ.කො.
ශික්ෂණ රෝහල
රාගම

# වැදූ මව පසුකරයි හැදූ මව



කතෝලික සභාව තුළ පැවිදි සොයුරියන්ගේ නිකාය ගණනාවක්, අසරණ කුඩා දූ දරුවන්ව බලා ගැනීම සහ හදා වඩා ගැනීම තම දූත සේවාවේ ප්‍රධාන තැනක් ගනියි. ඇතැම් පැවිදි සොයුරියන් දරුවන්ට දක්වන ආදරය, කරුණාව, කැපවීම සහ වැයවීම දේව ආදරයේ පිළිබිඹුවකි. එවන් පැවිදි සොයුරියන් වන ජේසුස් වහන්සේගේ සහ මරියතුමිය තුළ දයාවේ සොයුරියන්ගේ පැවිදි නිකායට අයත් ගරු බෙනිග්නස් සිල්වා පැවිදි සොයුරිය වචනයේ පරිසමාප්ත අර්ථයෙන්ම වැදූ අම්මා පසුකර හැදූ අම්මා වී ඇති දරු දැරියන් සිය ගණනකි. සුමීර ගුණසේකර එතුමියගේ මව්පදවිය අත්දැකපු අයුරු පහත සටහනින් බෙදා ගනියි. එතුමියට මෙන්ම මෙවන් දරුවන් වෙනුවෙන් සැබෑ කැපකිරීම් කරමින් මව් සෙනෙහස පිළිබිඹු කරන "වැදූ අම්මා පසුකරයි හැදූ අම්මා" තුළින් සැබෑ මව් පදවියේ උත්තරීතරත්වයට ගෞරව කරන අම්මාවරුන්ට මේ සටහන උපහාරයක්ම වේවා.

ඔබ විශ්වාස කරන්න, අද ඔබ දකින මං ජීවත් වෙන්නේ මේ ගැහැනිය නිසා. මට හුස්ම දුන්නේ මේ පතාක වෘක්ෂ ලතාව. එදා මගේම අම්මා ඉහළ අහසට මාව විසික්කා කරනකොට මේ අත් හරි උසට ඉස්සුණා. මං මේ අත්වල කක්කා කරා, මුත්‍රා කරා, වමනෙ කරා, එළිවෙනකල් කිරි ඉල්ල ඉල්ල ඇඬුවා. මගේ මතකය හෙණම ඈත අතීතයකට දුවනවා. මට ඇඬෙනවා ඉතින් මං අඬනවා. අද මේක ලියනවා.

හැමෝම මවුතුමිය කියද්දි මම මෙයාට අම්මා කිව්වා. හැමෝම මෙයාට වඳිද්දී මම මෙයාව ඉම්බා. ගරුත්වයක් නැති පාහරයා කියලා හුඟක් අය මට බැන්නා. ඒත් මේ අම්මා දන්නවා මං කොච්චරක් මේ අම්මට ආදරේද කියලා. ඔයාල කල්පනා කරලා බලන්න ඔයාගෙම අම්මා ඔයාව එපා කියලා විසික් කරනකොට, කොහෙට හරි දාලා යනකොට ඔයාට කොච්චර දුකක් දැනෙයි ද? ඒ වගේ තිත්ත අතීතයක් මට තිබුණා ඒ අතීතය පැණි රස කළේ මේ අම්මා. ඔයාලා දන්නවා මම ඔයාලට හුඟක් ආදරෙයි. ඒ ආදරේ මට ඉගැන්නුවේ මේ අම්මා. හුඟක් උන් මට හිනාවෙනකොට මං එක්ක ඇඬුවේ මේ අම්මා. දවසක් මං නොකරපු වැරද්දකට මට පොලීසියට යන්න වෙනවා. වැරැද්ද කරපු කෙනා දැන දැනත් පාවාදීමේ පුරුද්දක් නැතිකමට මාව හිරේ දානවා. මං එදා හොඳටම අඬනවා, මං පොලිස් කූඩුවේ අස්සේ එයා කූඩුවෙන් එළියේ. මට මතකයි එදා මේ අම්මට හොඳටම සෙම, හොටු බේරෙන නහය ඔය ලෝගුවෙන් පිහදදා, සාක්කුවේ තියෙන ලේන්සුවෙන් මගෙ කඳුළු පිහිදුවා. ඒ ලේන්සුව අදටත් පරිස්සමින් මං ළඟ තියෙනවා.

මං ආස හැමදේම අරන් දෙන්න දෙපාරක් හිතුවේ නෑ. මට අරක ඕනි මේක ඕනි කියපුවාම කොච්චර අමාරු වුණත් කාගෙන් හරි සල්ලි ඉල්ලගෙන මට ඒක ගෙනත් දුන්නා. මං ආස හැම පාඨමාලාවකට වියදම් කරා. අදටත් මං ජීවත් වෙන්නේ එයා දෙන කීයක් හරි පරිස්සම් කරගෙන. ඔබ විශ්වාස කරන්න එයා අද මං දිහා බලලා ගොඩක් සතුටු වෙනවා. මාව ටීවී එකේ දකිනකොට වෙන කාටත් වඩා එයාට සතුටුයි. මම ඉන්න එක වැඩසටහනක් හරි බලන්න බැරිවුණොත් එයා සති ගාණක් දුක්වුණා. මේක ලියද්දි තව සිදුවීමක් මට මතක් වෙනවා. කාලෙකට කලින් මට ලොකු ආසාවක් තිබුණ කොන්ඩේ ස්ට්‍රේට් කරන්න, සාමාන්‍ය සැලූන් එකට රුපියල් එක්දහස් පන්සීයක් ගන්නවා. මගේ අතේ එවෙලෙ සල්ලි තිබුණෙ නෑ. දවසක් මම අම්මට හොරෙන්

කාමරයට යනවා ගිහින් එයාගෙ මේසේ දිහා බලනවා. මේසෙ යට චූටි කාලෙ මාව වඩාගෙන ඉන්න ෆොටෝ එකක් තියෙනවා.

දැන් මං කොළඹ ජීවත් වෙනවා. මේ අම්මා වැඩිහිටි නිවාසයේ විශ්‍රාම සුවෙන් අපි දිහා බලාගෙන ඉන්නවා. මට හිතෙනවා මගෙ අම්මා බලාගෙන ඉද්දි වයසට යනවා දැන් 83 ක්. අද හම්බුණාම මගෙ මේ චූටි අත අත ගගා ඉස්සර මං හරියට මේ පොඩි අත ඇද ඇද අනිත් අත වගේ හදන්න උත්සාහ කරා කියලා, මාව බදාගෙන ඉඹිනව, නළල කුරුස ලකුණින් ආශීර්වාද කරනවා. ඔබ විශ්වාස කරන්න තවමත් මේ ගැහැනිය ධාරානිපාත වැස්සක් සේ දේව සේවය කරනවා. මං වගේ ළමයි දස දහස් ගණනක් ජීවත් වෙන්නේ එයා නිසා. එයා හදපු ළමයි අද වෛද්‍යවරියන්, නීතිඥවරියන්, ගුවන් නියමුවරියන්, මාධ්‍යවේදිනියන්, ගුරුවරියන්. කොන්වන්ට් එකක් අස්සේ හැදුණ එකම කොලුවා මං. ඉතින් එයා අදටත් බලාගෙන ඉන්නවා ඒ හැමෝම අතර මම කවුරු වෙයිද කියලා ? මං දන්නෙ නෑ හෙට එයා මැරෙයිද කියලා. ඒත් එයාට හිතේ සතුටින් මැරෙන්න පුළුවන් වාතාවරණයක් මේ පුංචි කොල්ලා ඇති කරමින් යනවා. අම්මේ ඉස්සර වගේම මාව විශ්වාස කරන්න. මේ පුංචි කොලුවා ඔයා ප්‍රාර්ථනා කරපු ජීවිතය ගත කරනවා. ඔයා කතෝලික තමයි නමුත් මගේ ප්‍රාර්ථනාව ඔයා කවදහරි බුදු වෙන්න ඕන. ඔයා කවද හරි සාන්තුවරියක් වෙන්න ඕන. මේ මගේ ජීවිතේ ලොකු කතාවක චූටි කොටසක්. මේ අම්මා ගැන තව කතන්දර හුඟක් තියෙනවා දවසක මං පොතක් එළියට දැම්මහම ඒ කතන්දර ගොඩක් ලෝකයාම කියවයි. එතෙක් පොඩි පොඩි පරිච්ඡේද විදිහට එතුමිය ගැන ලියන්නම්. ඕන් ඉතින් මේ පුංචි කොල්ලා ආයෙත් අඬනවා. සුමීර මට අඬන්න බෑ. තව වැඩ ගොඩක් තියෙනවා, මං මට එහෙම කියාගන්නවා. ඉතින් මේක කියවන ඔබට මං කියන්නේ ගිහින් අම්මට ලොකු උම්මා එකක් දීලා කියන්න අර සුමීරගෙ අම්මා දාලා ගියාට මගෙ අම්මා මාව දාලා ගියේ නෑනේ කියලා. ගිහින් හයියෙන් බදාගෙන උම්මා එකක් දෙන්න, මොකද හෙට ගැන ෂුවර් නෑ මිත්‍රවරුනි. ඒ නිසා ඉන්න කල් අම්මට ආදරේ කරන්න පණ ඇරලා මට මේක තවත් මාර වචන දලා ලියන්න පුළුවන් ඒත් එහෙම ලියන්න අත හයිය නෑ. වෙව්ලනවා ආදරේ දරාගන්න බැරිව.

**සුමීර ගුණසේකර**

ස්වෛරීත්වය... 5 වන පිටුවෙන්.....

අපට පෙනෙන මානයේ නැතැයි සමහරු පැවසීම අතිශයින්ම සාවද්‍යය. හේතුව ඕනෑතරම් අප රටේ නායක නායිකාවෝ සිටිති. ඔවුන්ව නිරීක්ෂණය කරමින් නිවැරදිව හඳුනාගැනීම සහ හඳුන්වා දීම යුගයේ අවශ්‍යතාවකි. ඒ යුතුකම සහ වගකීම මගහැරුණු විට රට වනසන, රට බංකොලොත් කරන, බොරු කියන, ජන හදගැස්මට අසංවේදී ජනතා නියෝජිතයන් රටේ සම්පත් හූරාගෙන පොහොසත් වන අතර සාමාන්‍ය ජනතාව පීඩනයෙන් පීඩනයට ගොදුරු වී අන්ත අසරණ වී අනේ අපොයි කියති. ජනතාවක් ලෙස අප, මාතෘ භූමියේ නිෂ්පාදන ආර්ථිකය, හැකි උපරිමයෙන් අපනයන කේන්ද්‍රය ලෙස සකස් කළ යුතුවෙයි. ස්වෛරීත්වය අභියෝග යට ලක්කරමින් සිදුවන ඉන්දීය ධීවර ගැටලුවට, අනවසර තෙල් ගවේෂණ කරන බටහිර යැංකියන්ට හා අනවසර ඩ්‍රෝන යාන එවන අසල්වැසි රාජ්‍යවලට යම් රාජ්‍ය තාන්ත්‍රික ලෙස විරුද්ධ බව හැඟවිය යුතු අතර, අප දේශසීමා රැකගත යුතුවෙයි. අප රටේ අත්‍යවශ්‍ය ද්‍රව්‍යවලින් වැඩිමනත් යුක්‍රේනයෙන් හෝ රුසියාවෙන් ආනයනය කරන භාණ්ඩ නොවන අතර, ආහාර ස්වයංපෝෂිත හා යම් සංචිත රඳවා ගැනීමට ප්‍රතිඵල ඇති වැඩ පිළිවෙලක් වුවමනා වෙයි. මව්බිම කෙලෙසන අයට නීතිය ක්‍රියාත්මක කළ යුතු අතර එක රටක් එක් නීතියක් වෙනුවට එක රටක් එක් වේලක් කරපු අය අපට නැවත වුවමනා නොවන බව දැඩි ලෙස ප්‍රත්‍යක්ෂ කරකගත යුතු වෙයි. මේ මාගේ දේශපාලන න්‍යායපත්‍රය නොව මාගේ සරල ආර්ථික න්‍යාය පත්‍රයයි.

# මවක වන්නේ හෙට නොවේ අද

නිතොර වර නැගෙන්නේ මවක වීමට ලැබීම ආශිර්වාදයක් බවයි. එසේ නම්, මවක් වීමට නොලැබීම සාපයක්ද? විවාහ මංගල පූජාවලදී ඔබට දෙවියන් දරුපලෙන් ආශීර්වාද කරත්වායැයි යාච්ඤා කෙරේ. එසේ තිබියදී යම් විවාහක යුවලකට දරුවන් නැති වීම යනු ඔවුන්ට දෙවියන් ආශීර්වාද නොකිරිමක්ද?

"නැත". මවක් වීම යනු තමාගේම කුසෙන් දරුවකු බිහි කිරිම යන්න යල්පැන ගිය අදහසකි. තමන්ගේම දරුවෙක් පරම්පරාව ගෙනියන දරුවෙක්. අපේ ලේ තිබෙන දරුවෙක් යනු ගෝත්‍රික යුගයේ අදහසකි.

මවක වීම, පියෙක් වීම යනු ප්‍රේමයේ භූමිකාවකට පණ පෙවීමක් මිස ලේ ධාතුව පිළිබඳ කාරණයක් නොවේ. තමන්ගේම දරුවෙක් හදා වඩනවාට වඩා දරුවකු ගෙන හදා වඩන මව්පිය යුවලක් ශ්‍රේෂ්ඨය.

ගැහැනියක් හා පිරිමියෙක් මවක පියකු වීමට සූදානම් විය යුත්තේ විවාහයට පසුව නොවේ. කුඩා කල සිටමය. මාතෘත්වය හා පිතෘත්වය සඳහා සූදානම දරුවකුගේ කුඩා කාලයේ සිටම සිදුවන්නකි. ඒ සඳහා ඔහු / ඇය කුඩා කළ සිටම සූදානම් කරන බව දැන ක්‍රියා කළ යුත්තේ මව්පියෝය. පවුල තුළ ලබන ජීවිත අත්දැකීම මවක පියකු වීමේ දූරස්ථ සූදානමයි. කුඩා දරුවන් සෙල්ලම් ගෙදරකදී සිදු කරන්නේ එයයි. බෝනික්කාට පහර දෙමින් බෝනික්කා නළවන කුඩා දරුවන් තුළින් පෙන්නුම් කරන්නේ දරුවා ලබන ඒ පුහුණුවේ ස්වභාවයයි.

මවක පියකු වීමේ දැනුවත් සූදානම නව යෞවනයේ අග සිට සිදුවිය යුත්තකි. එය නව යොවුන් හා තරුණ අධ්‍යාපනයේ කොටසක් විය යුතුය. එහි පළමු දැනුම තමාට තමාගේම දරුවකු ලැබීම හා නොලැබීම සිදුවිය හැකි බවට වන දැනීමයි.

දෙවැන්න නම් මවක පියකු වීම කෙරෙහි තමන් යෞවනයේදී තාරුණ්‍යයේදී ලබන දැනුම, ගොඩනගා ගන්නා ආකල්ප, ආධ්‍යාත්මිකත්වය පෝෂණය ආදිය තදින් බලපාන බව තේරුම් ගැනීමයි.

සමාජ සම්මත සිහින් සිරුරක් සඳහා පෝෂණය නොසලකා හරින 'ඩයට් ප්ලෑන්' කරන යුවතියක අහිමි කරගන්නේ දරුවකු වෙනුවෙන් ලබා ගත යුතු නිසි පෝෂණයයි. දරුවාගේ පෝෂණය, සෞඛ්‍යය තීරණය කරන්නේ හුදෙක් කුසට දරුවකු ආ පසු ලබා ගන්නා ප්‍රචාරණ දැන්වීම්වල පළ කෙරෙන කිරිපිටි වර්ග නොවන බව මව්වරුන් වීමට සිටින්නෝ දැන ගත යුතුය.

දරුවකු පිළිබඳ වැදගත්ම දේ දරුවකු ලැබීමට මව්පියන්ට ඇති ආසාව නොවේ. උපත ලබන දරුවාගේ ජීවිතයයි. ඒ නිසා ජානමය රෝගවලට මග පාදන විවාහයක්, නිසි වයස ඉක්මවා ඇති විට අවදානම් සහිතව දරුවකු ලැබීමට ක්‍රියාකිරීමේ ගැටලු පිළිබඳවද අවබෝධයක් තිබිය යුතුමය. දරුවා සදාතන රෝගියකු බවට පත් වීමට දැන දැන ඉඩදීමේ ආත්මාර්ථයෙන් අප මිදිය යුතුය.

අද බටහිර ලෝකයේ රටවල තරුණියන් දරුවකු හදා ගැනීම වයස තිස් ගණන් දක්වා පමා කරන්නේ ඊට තරුණ වයසේදී දරුවකු ලබා ගැනීමට අදාළ තමන්ගේ බීජ කලින් බැංකුවක තැන්පත් කරමිනි. ඒ පමා වුවද නීරෝග දරුවෙකු ලැබීමේ ක්‍රියාමාර්ගයක් වශයෙනි.

තුන්වැන්න මවක පියකු වීම ඉතා විශාල වගකීමක් බව ගැඹුරින් අයිති කරගත් තරුණයන් තරුණියන් වීමයි.

මවකට සිතුවිල්ලකින් වත් වරදක් කළ නොහැකිය. ගර්භිණී සමයේ මවගේ සිතුවිලි දරුවා කෙරෙහි බලපායි. කොතරම් බරපතළ ප්‍රශ්න තිබුණද ඒවායින් මනස පීඩාවට පත්

කර ගැනීම, වෛරී සිතුවිලිවලින් පිරී සිටීම දරුවාට බලපායි. එවන් තත්ත්වයකට තම බිරිඳ පත් නොකරන ස්වාමි පුරුෂයකු වීමට අවශ්‍ය ආධ්‍යාත්මිකත්වය පියකු වන්නට යන තරුණයාද ගොඩනගා ගත යුතුයි.

තම බිරිඳ ගැබ්බරව ඇතැයි පැවසූ මොහොතේ සිට තරුණයා මුළු හදවතින් අධ්‍යාත්මයෙන් මනසින් තමාත් ගැබ්බරයි යනුවෙන් සිතිය යුතුය. සිතා කටයුතු කළ යුතුය. දරුවකුගේ පළමු සම්බන්ධය මව බැවින් විශේෂයෙන් යුවතියක් ඒ සඳහා ගැඹුරු කායික මානසික ආධ්‍යාත්මික ශක්තියක් ගොඩනගා ගත යුතුය.

මවක පියකු වීම නොසිතූ නොපැතූ මොහොතක වන්නක් නොවිය යුතුය. ශ්‍රී ලංකාවේ දරු උපත්වලින් සෑහෙන ප්‍රමාණයක් පමණ සැලසුම් නොකළ දරු උපත්ය. එහි ප්‍රතිඵලය වන්නේ ආරම්භයේදීම ප්‍රතික්ෂේප වූ දරුවකු බවට දරුවා පත් වීමයි. සැලසුම් කළ අපේක්ෂිත හරසරින් පිළිගන්නා දරුවකු ලෙස සෑම දරුවකුම උපත ලැබිය යුතුය.

විවාහයට නොව 'වෙඩින්' එකට සූදානම් වන වර්තමාන තරුණ තරුණියන්, සමාජ සම්මත 'නයිස් පැකේජ්' එකක් ලෙස මනා පෙනුම, සුදු කෙට්ටු ශරීරය ආදි වටිනාකම් තුළ තමන්ව සකසා ගන්නට මහන්සි වන තරුණ තරුණියන් බරපතළ ලෙස කල්පනා කළ යුත්තේ ක්‍රිස්තු වටිනාකම් ගැනයි. මෙහිදි මාතෘත්වයේ දෙව්දහමින් තරුණියන් පෝෂණය කළ යුතුය.

හද යෞවනයේ පසු වූ මරියාත් තරුණ ජුසේත් ජේසු දරුවාව බාරගත් හැටි ඔවුන් දෙදෙනා මාතෘත්වය හා පිතෘත්වය පිළිබඳ නියම මිනිස් දූ පුතුන් දෙදෙනකු ලෙස විශාල අර්බුද මැද ක්‍රියා කළ හැටි උසස් ආදර්ශයකි.

මහින්ද නාමල්

# මව් පදවිය

එදා පිළිසිඳුණු දා සිට
පරිස්සම් වී මොනවට
ගුණ අහර හැමවිට
ගනී අදරින් කුසේ දරුවට

උපන් දුව සිපගෙන
තුරුලු කර උණුසුමින් නොමඳින
සිය ලේම කිරි කරගෙන
පෙවී සෙනෙහැතිව අපමණ

උස්මහත් වී වැඩුණත්
ඉගෙන නිලතල දැරුවත්
විවා වී වෙන්වී ගියත්
අම්මා නැතිව කලක් නම්නැත්

සිය සැමියාට අදරින්
සියලු දරුවනට සෙනෙහසින්
නෑසියන් හිතවත්කමින්
මව්පියන් අමතක නොකර දමමින්

සිය හිත වෙන වෙන අත
නපුරු සිතිවිලි කරා එළඹෙන
දරුකැල රැකුම මත
නියම අම්මා වැනෙන්නේ නැත

දෙවියන් ජනයා අබිමුව
හඬදුන් එම පොරොන්දුව
ඉටුකර සතුටු සිතැතිව
ඉන්න අම්මේ පවුලටම ලැදිව

පිලීෂන් අබයකෝන්

# මෙන්න ඔබේ මෑණියෝ

"මව් කුස හොත් අවධියේ සිට උපත ලැබූ දිනයේ සිට මා රැකගත් දෙවිඳාණෝ ඔබ ය" (ගීතාවලිය 22:10).

ජීවිතයේ මිහිරිතම වේදනාව විඳිමින් ඔබවත් මාවත් මේ ලොවට තිළිණ කළ ගෞරවාචාර යොමු වන්නේ ඔබෙත් මගෙත් සදා ආදරණීය අම්මාවරුන්ට ය. ඇයි ඒ වේදනාව ජීවිතයේ මිහිරිතම වේදනාව වන්නේ? තවත් ජීවිතයක් ලොවට තිළිණ කරන්නට විඳිනු ලබන වේදනාව නිසාය. අපි කොයි කවුරුන් හෝ කොතැනක අසුන් දරා සිටියත්. මවගේ දෙපා මුල දණින් වැටිය යුතුය. ඒ ඇයි? ලොව අන් කිසිවකුදු ගැහැනියකගේ ලේ කිරට හැරෙන්නේ නැත. හැරුණ නම් හැරෙන්නේ මේ සදාදර නියමයන්ගේ සිරුරේ රක්ත වර්ණ රුධිරය පමණයි කිරට හැරෙන්නේ. මේ මවගේ උත්තරීතර මව් කුසින් උපත ලද උපත ලබන කිසිම බිළිඳු කිරිකැටියෙක්ව උස් මහත්කර කවා පොවා අංගසම්පූර්ණ පුරවැසියකු කර සමාජයට තිළිණ කරන තෙක් මේ ගෞරවණීය මෑණිවරුන් ඔබ මා හැර නොයනු ඇත. කිසිදා මිලකළ නොහැකි අමිල මෙහෙවරක් මේ බැතිබර මව්වරුන් විඳ දරාගෙන ඇත්ද?

මොන තරම් දුක් ගැහැට විඳින්නට ඇතිද?

මොන තරම් නිදි වර්ජිතව සිටින්නට ඇත්ද? මොන තරම් ගිනි උහුලන්නට ඇත්ද? සෙනෙහෙබර මවකගේ විනිවිඳ දකින ගති පැවතුම් එයයි. ලොවේ උතුම් පදවිය මව් පදවිය වන්නේ අන්න ඒ නිසයි. ඒ අමරණීය මව් පදවියට අප කෘතගුණ දැක්විය යුතු ඒ නිසයි. ඊට සාපේක්ෂව වත්මන් සමාජය තුළ මේ මව් පදවියට සිදුව ඇත්තේ කුමක්ද? සිදුවන්නේ සිදුවෙමින් පවතින්නේ කුමක්ද?

මේසා විශාල දුක් කම්කටොලුවලට මුහුණ දෙමින් ඔබ මා දෙපයින් නගා සිටුවන්නට අප්‍රමාණ වෙහෙසක් දැරූ වෙහෙසක් දරන ඒ දයාබර මාපියන්ට සිදුව ඇත්තේ කුමක්ද? මත්ද්‍රව්‍ය ව්‍යසනයට තම දූපුතුන් ගොදුරුවීමෙන් දුක්ගිනි උහුලන මාපියන්, මේ පුංචි කොදෙව්ව තුළ ඔබට මට කොතෙක් නම් මුණ ගැසෙනවා ද? මේ අයුරින් විකෘත වී, විනාශ වී, යන්නේ හෙට දවසේ මේ පුංචි කොදෙව්වේ හිමිකරුවන් වීමට සිටින පුංචි මල් කැකුළු නේද? මේ මල් කැකුළු දෙස බලාගෙන මැරි මැරී උපදින්නේ ඔබෙත් මගෙත් දයාබර මාපියන් නේද? තම දරුවන්ට දිය හැකි දෑ උපරිම ශක්තියෙන් දුන් පසු, ඔවුන් උස් මහත් වී, බොහෝ විට විවාහ වූ පසු තම වයෝවෘද්ධ දෙමව්පියන් නොසලකා, මග හරින, මහ මග දමා යන, ඇතැම් විට කුකුළු කොටුවල සහ බලු කූඩුවල, නැතිනම් කාමරවලට කොටු කරන දූ පුතුන් මේ සමාජයේ අතලොස්සක් හෝ ජනමාධ්‍යවලින් අපට දැක ගත හැකිය.

ඔබ මා අතර මව් පදවියට කෘතගුණ දක්වන දූ පුතුන් ඉන්නේ කීයෙන් කී දෙනාද? සොඳුරු තලයේ සිට පොඩ්ඩක් පහත මාලය දෙස බලමු.

ඔබ මා සඳලු තලයට ඔසවා තැබූ මාපියන් සිටිනා තැන. එදා මෙදාතුර ඔබෙත් මගෙත් පැවැත්ම ගැන අතීතාවර්ජනයක යෙදෙමු. ඔබ මා විසින් මේ සෙනෙහෙබර මාපියන් ඔසවා තැබිය යුතු තැන ගැන පොඩ්ඩක් නැවතී හැරී බලමු. මේ සෙනෙහෙබර හදගැස්ම වෙත ඔබෙත් මගෙත් සිත්මල්යාය තුළ දෝංකාරය දෙන අයුරු! මේ සෙනෙහෙබර මාපියන්ගේ හදගැස්ම ඇට, මස් ලේ, නහර තියන දුවකට, පුතකුට දරාගත හැකිද?

ඊට සාපේක්ෂව සමස්ත මිනිස් සංහතියේ සදාතන මෑණියන් වන කන්‍යා මරිය මාතාවන්ගේ චරිතාපදානය දෙස හැරී බලමු. ගවහලේ සිට කල්වාරි කඳු මුදුන කුරුසිය පාමුල වැතිර වැටී මේ සදාතන මෑණියන්ගේ උකුල මත තම පුතුගේ නිසල වූ සිරුර පුනවනු ලැබූ ඒ අනපේක්ෂිත නිමේෂය

දක්වා තිස් තුන් වසරක කාල පරාසය වෙත හැරී බලමු. මේ සෙනෙහසේ උල්පත වූ කුමරි මරියාවන්ගේ නෙතු අගින් ගැලූ කඳුළු එක් වූවා නම් ඉන් ලොව දිගම ගංගාව නිම වන්නට ඉඩ තිබුණි. මේ කඳුළු කිසිවිටක ශක්තියක් වූවා මිසක විලාපයක් නොවුණි. තම දූ පුතුන්ට යුක්තිය, සාමය, සාධාරණත්වය ඉටු කරදීම සඳහා මේවනතුරු සුවහසක් මව්වරුන්ගේ උණු කඳුළු බින්දු මේ මිහිකත සිප වැළඳ ගනියි. මල් සුවඳ සේ, ගහට පොත්ත සේ, සැම නිමේෂයකම මේ දයාබර මෑණියෝ පුතු අසලම සිටියාහ. එදා කානාවේ මගුල් ගෙදර තම මෑණියන්ගේ ඉල්ලීමට අවනත වෙමින් ජලය මිදියුෂට හරවා ප්‍රථම පෙළහර ජනගත කළේ මොනතරම් නිරහංකාරවද? එදා ඒ තම ප්‍රථම පෙළහර මල්පල ගැන්වීමට පසු තැළෙන, පෑගෙන, පොඩි වෙන, බැටකන, ජනතාවගේ නෙතු කඳුළු පිසදමන්නට ඔවුන් වෙනුවෙන් යුක්තිය, සාමය, සාධාරණත්වය, ඉටු කරන්නට නිතරම තම පියාණන්ගේ කැමැත්ත ඉටු කරන්නට පියවර ගත්තාය. සෙනෙහසේ උල්පත වූ මේ සමස්ත මානව සංහතියේ දයාබර මෑණියෝ එදා මෙන් අදත්, අද මෙන් හෙටත්, විටින් විට ඔබට මට මග පෙන්වමින් ඔබ මා අසල රැඳී සිටිති. වික්ෂෝප මෑණියෝ, සදාසරණ මෑණියෝ, ලූර්දු මෑණියෝ, පාතිමාවේ මෑණියෝ, දේවමෑණියෝ ගර්භවාස මෑණියෝ, රෝස කුසුමේ මෑණියෝ මෙවැනි විවිධාකාර නම්වලින් මෙතුමිය හඳුන්වනු ලබන්නේ ලෝකයේ විවිධ රටවල දර්ශනය වෙමින් සුවහසක් බහුතරය නෙතු කඳුළු පිස දමන නිසාය. සුවසහනය දෙන නිසාය. මේ බැතිබර දේව අම්මාගේ මධ්‍යස්ථකම තුළින් ජීවමාන කිතු සමිඳුන්ගේ ජීවමාන බලය දකින්නට, ඇදහිල්ලේ පන්නරය ලබමු. දෙව් මවුගේ සළු සෙවණේ රැකවරණය ලබමු.

**ඩී. ෂෙල්ටන් සමරසිංහ**

## විදූ මවුනි අවසරයි ලැබදෙන්න නැමලුම්

පුරා දහතුන් වසක් ලැබ ඔබේ උණුසුම්
අ යනු ආ යනු ගැලපු මතකයේ සැමරුම්
ජීවිතය ජයගන්න ලබාදුන් ඉගෙනුම්
මතක් කරමින් මවුනි දෙමි මෙසේ පැසසුම්

වතු පුරා ඇවිදිමින් අප දැමූ සෙල්ලම්
ගුරු මවුගේ පහරින් උගත්තෙමි පාඩම්
සදා හදවතේ රැඳි මිතුරුදම් රන්දම්
දෙමි සදාකල් මවුනි මේ උතුම් පැසසුම්

ආදරැති ගුරුමවුන් ඉගැන්වූ පාඩම්
දෙව් සමිඳු මඟ යන්න ලබා දුන් ගුණ දම්
විදු මවුනි දෙවනි මව් ඔබ සදා මට නම්
දෙවිසමිඳේ දෙවනි මවු සැමදා රකින්නම්

අමාශා තිලකරත්න
මහබාගේ

# MOTHER LANKA AND DEMOCRACY

Recently one of my learned friends told me that he no longer believes in democracy. I was quite interested to know his reasons because this sublime system of government in which the people of a country can vote to elect their representatives has done so much to development of many countries. His first argument was that Sri Lanka hasn't made a significant development practicing democracy. Second Sri Lanka had developed by leaps and bounds under kings and foreign rulers. Third if a vast majority of Indians were Buddhists or clergy instead of Hindus, India would not develop to their present prosperity. Of course, this is an opinion. I warned him not to be so outspoken making blunt controversial statements and it is hard to imagine any correlations between practiced religions, development and democracy. With no comment on his third argument, I encouraged him to further explain his first two arguments.

If democracy elects right, righteous and capable leaders in Sri Lanka, undoubtedly Sri Lanka develops. The present crisis that all Sri Lankans are undergoing has made the majority of conscientious Sri Lankans realize, the right politicians haven't been selected to the parliament where the fate of a nation is decided since 1948. This simply implies democracy hasn't worked in Sri Lanka. I was compelled to agree with my friend. Then what has worked in Sri Lanka is a topic for research. If votes can be bought and innocent people can be hoodwinked with false promises, there is no democracy. If biased media supporting one political party influences the freewill of the people with their massive brainwashing campaigns, there is no democracy. If the people can plan to come to power killing innocent people praying in churches, there is no democracy. Where is democracy if leaders can manipulate Easter bomb attack evidence and free criminals at whim. This is absolute dictatorship and tyranny under the cover of democracy.

Socrates believed the best form of government is neither tyrannical nor democratic. Rather, people should be governed by those with the greatest knowledge, abilities and virtues. Has it been happening in Sri Lanka? Sri Lanka, which had been ruled by kings and foreign emperors, has been governed by privileged ancestral families after independence in contrast to Aristotle's leader that the most intelligent and the virtuous in the land should rule the country. So incompetent ancestral leaders' trial and error decision-making and ad hoc commission-oriented self-benefitting mega projects are the so-called government in Sri Lanka with the democracy name board. There are potential young men who can become President of the country. But only children born in one nationality and one religion can dream to be the first citizen of the country. Nobody argues and goes to Geneva to complain this discrimination and violation of human right of future gifted children.

In most countries if you think differently, you become a leader. But in Sri Lanka, if you think you often cease to exist. So, whether to think or not is a dilemma for them. However, the dire consequences people undergoing now not only compel them to think but also make them regret reflecting their follies and blunders. It is unfortunate to live in a country where the blind leading the blind. The intellectually honest, virtuous and capable people who see should come to rule Mother Lanka one day, how? should be strategically meticulously devised with alternatives and contingency plans. Isn't this vague and intriguing and aren't we lost in a wilderness of mirrors? Alas! my friend made me too disbelieve in democracy.

**K. C. Grero**
Senior Lecturer
Former Oblate Scholastic

# විමසීම

දැන ගැනීමට කැමති මා නොදන්නා දේය
පැහැදිලි කර ගැනීමට කැමති අපැහැදිලි දේත්
මම ඔබෙන් විමසමි.

අප අතර ඇති නො එකඟතා මොනවාදැයි
හඳුනා ගනු පිණිසත්
මගේ අනුමානයන්
කොතෙක් දුරට නිවැරදි දැයි අවදිවනු පිණිසත්
ඇතැම් දේ මම ඔබෙන් විමසමි.
ඔබ ගැනත් මම ඔබෙන් විමසමි.
හැකිතාක් ඔබව තේරුම් ගැනීමට
මා කැමති නිසාය

විමසීමට මට නිදහස ඇතත්
මවෙත පිළිතුරු දීමට හෝ
මවෙත විවෘත වීමට හෝ ඔබ බැඳී නැත.
ඔබට හිමිවිය යුතු ඒ නිදහසට
මම ඉතා ගරු කරමි.

ඇතැම් දේ මා විමසනවාට
ඇතැමුන් කැමති නැත.
නමුත් කරනුයේ
ප්‍රශ්නය උපහාසයට ලක් කරමින්
ප්‍රශ්නයට පහරදීමය.
එවන් ප්‍රතිචාර සදාචාරාත්මක නැතත්
එසේ කරන්නට ඔවුන්ට ඇති නිදහසට
මම ඉතා ගරු කරමි.

මගෙන් ඔබ කරන ඕනෑම විමසුමකට
මම ඔබට ස්තුති කරමි.
හරි හෝ වැරදි හෝ විය හැකි මම
මා දන්නා තරමින් අවංකව පිළිතුරු දෙමි.
දේශනාවාදී නොවී
හැකි තාක් කෙටියෙන්
එහෙත් නිරවුල්ව පිළිතුරු දෙමි.
පැහැදිලි පිළිතුරක් මට නොමැති නම්
නොසඟවා නොදැනුම හෙළි කරමි.
මැනවින් පැහැදිලි යයි
අප හිතාගෙන ඉන්නා බොහෝ දේ අතරින්
ප්‍රත්‍යක්ෂ ලෙසම අප දන්නේ
ඉතා ස්වල්පයක් පමණි.

අපේ නොදැනුම හා අපැහැදිලිකම්
අපට පෙනී යනුයේ
යමකු අපෙන් ප්‍රශ්න කරන විටය.
ප්‍රශ්නයක් මතුකිරීම යනු
අපට අපැහැදිලි කොතැනදැයි හඳුනා ගැනීමකි.

වැදගත් වනුයේ එම හඳුනාගැනීම මිස
ඊට පිළිතුරු වශයෙන් වූ
අපගේ අනුමානයන් නොවේ.
දෙනු ලබන පිළිතුරට වඩා
විමසනු ලබන ප්‍රශ්නය වැදගත්ය.

ප්‍රශ්න කළ යුත්තේ
යමකු අදහස් කරනුයේ කුමක්දැයි
නිවැරදිව තේරුම් ගැනීම පිණිස මිස
තර්කයෙන් ඔහුට පහරදීම සඳහා නොවේ.

ප්‍රශ්නය නිවැරදි විය යුතුය.
එමෙන්ම විමසනුයේ කුමක්දැයි
පහසුවෙන් තේරුම්ගත හැකි විය යුතුය.

ප්‍රශ්නය අවංක විය යුතුය.
පිළිතුර ඔබ දනී නම්
ඔබගේ ප්‍රශ්නය අවංක නැත.

ඔබ තුළ ඇති පිළිතුරට ගැලපෙන සේ
ප්‍රශ්නයක් නිර්මාණය කිරීම තුළ ඇත්තේ
යමක් පැහැදිලි කර ගැනීමේ
අවංක චේතනාව නොව
යමක් ඉගැන්වීමේ කූට අරමුණය.

(විද්‍යාත්මක, තාක්ෂණික හා ශාස්ත්‍රීය කරුණු
සම්බන්ධයෙන් උගැන්වීමේ එම ක්‍රමය යහපත්
බව සැබෑවකි)

**සපුගස්කන්දේ රංජිත්**

## සියක්වස සපුරන මරියතුමියගේ හමුදාව

මරියතුමියගේ හමුදාවේ ක්‍රමය අති සුවිශේෂ එකකි. (XXIII ජුවාම් ශුද්ධෝත්තම පියතුමා 1960 වසරේ දී).

කිතු වසින් 1921 ක් වූ සැප්තැම්බර් මස 07 දා බදාදා සවස 07.00 පමණ අයර්ලන්තයේ ඩබ්ලින් නුවර ෆැන්සිස් වීදියේ 'මයිරා' නමැති ගෘහයේ අහුඹු ලෙස උපත ලද මරිය තුමීගේ හමුදාවේ සියක්වස සපිරි සංවත්සරය සමරන මේ කාලයේ දී XXIII ජුවාම් සුදුතුම් පියාණන් පවසන ලෙසටම මරියතුමීගේ හමුදාව අති විශේෂබව සනාථ වනු ඇත. හමුදාවේ නිර්මාතෘ ප්‍රැන්ක් ඩෆ් සොයුරු සමග ආරම්භයේ සිටියේ කාන්තාවන් අටදෙනකු සමග මයිකල් තොහාර් පියතුමා පමණි. ඉතා සුළු පිරිසකින් ඇරඹි මරියතුමියගේ හමුදාව සියක් වසක් සපිරෙන විට විශ්වයේ දේශ දේශාන්තරයන් 182 ක් ඉක්මවා ප්‍රචලිත වී ඇත. මිලියන 10 කටත් වැඩි සෙබළ බල ඇණියකින් සන්නද්ධව ජනතාවගේ හදවත් ස්පර්ශ කරමින් යාච්ඤාව හා මෙහෙවර තුළින් ගිය ගමන හරිම අපූරුය. මේ ගැන විග්‍රහ කරන අත්පොතේ පළමුවන පර්ච්ජේදයේ තුන්වන පිටුවේ මෙසේ සඳහන් වේ. ''කෙතරම් අපූරු සිදු වීමක් ද මෙසේ චාම් ලෙස එකතු වූ අප්‍රසිද්ධ මිනිසුන් ස්වල්ප දෙනකුගේ කෙටි ගමනක දී කෙටි දුරක දී මෙවැනි මහත් යහපතක් සිදුකළ හැකි බලවේගයක් ඇති කර ගත හැකියැයි කිසිවෙක් සිතුවේ ද?'' එහෙත් එය එසේම සිදු වී ඇත.

දේව අම්මාගේ උපන් මංගල්‍යය සැප්තැම්බර් මස 08 වන දිනට යෙදී තිබිය දී 07 වන දින සවස් භාගය තෝරා ගැනීම අහඹු සිදුවීමක් ලෙස පෙනෙන්නට තිබුණත් මෙය දේව අම්මාගේ හස්තයෙන් සිදුවූවක් බව මතු කාලීනව පැහැදිලි වන්නට විය. (උත්පත්ති පොතේ 1:5) අනුව ආලෝකය සහ අන්ධකාරය අතර වෙනසින් දවස සැදිණ. දේව අම්මාගේ උපන් මංගල දිනයේ අවසාන සුගන්ධය නොව ප්‍රථම සුගන්ධය විහිද වූ ඒ සන්ධ්‍යාව මරියතුමියගේ ස්වරූපය මනුෂ්‍යයන් තුළ පිහිට වීමත් එමඟින් දෙවියන් වහන්සේට ප්‍රශංසාව දෙමින් මනුෂ්‍යයන් වෙතට ලඟා කිරීමත් පරමාර්ථ කොටගෙන ඇති සංවිධානයක ආරම්භයට සුදුසුම අවස්ථාව බව අත්පොතේ තුන්වැනි පිටුවේ සටහන් වන අතර හතර වැනි පිටුවේ සටහන් වන වැකියේ ද මරිය තුමීගේ හමුදාව ගැන කියන්නේ ප්‍රබල කියමනකි. එනම් "මරියතුමීගේ හමුදාව කතෝලික සභාවේ සැබෑ මුහුණුවර ඉදිරිපත් කරයි." (ශුද්ධවූ XXIII ජුවාම් සුදුතුම් පියාණන්)

මරියතුමීගේ හමුදාව කලින් සැලසුම් කොට ආරම්භ නොකිරීම තුළ නීති රීති ක්‍රියා පටිපාටි පිළිබඳ පෙර සැලසුමක් නොවීය. දේව මාතා පිළිරුව අබියස දණින් වැටී ශුද්ධාත්මයන් නැමඳ ඉතාම සරල භක්ති අභ්‍යාසයක් වූ ජපමාලය ධ්‍යානය කිරීමෙන් අනතුරුව සිදුවූයේ හරිම අපූරු දෙයකි. ඔවුන්ගේ සාකච්ඡාවට බඳුන් වූයේ එකම එක් දෙයකි. දේව අම්මාගේ පාලනයට නතු වෙමින් දෙවියන් වහන්සේ ප්‍රසන්න කිරීමටත් මනුෂ්‍යයන් ලවා උන්වහන්සේට ප්‍රේම කිරීමටත් කුමක් කළ යුතුද යන්නය. මෙතැනින් ඇරඹි මරියතුමීගේ හමුදා වංශකථාව දිනෙන් දින පරිණත වෙමින් තමා පරිශුද්ධ වෙමින් අනිකා පරිශුද්ධ කිරීමේ දහැමි පදනම සපථ කරන්නට පා එසවූයේ සභා ශ්‍රේෂ්ඨයන්ගේ මඟ පෙන්වීම යටතේ කීකරුව ශුද්ධවූ සභාවේම කොටසක් සැටියටය. එසේම මරියතුමීගේ ලීලාව හමුදාවේ ලීලාව සැටියට හිස් මුදුනින් පිළිගෙන ගැඹුරු බැගෑපත්කම, පරිපූර්ණ කීකරුකම, යාච්ඤාශීලී භාවය, ඉවසීම ස්වයං කැපවීම, ධෛර්යාන්විත භාවය, ස්වර්ගීය ප්‍රඥාව, නොකැළැල් පිවිතිරියාව, ජීවිතයට මාංසගත කර ගනිමින් කිසිවිටක මෙය කළ නොහැකියැයි කියා මැසිවිලි නොදෙඩූ දේව අම්මා මෙන් සියල්ල කළ හැකිය යන සංකල්පය මත පිහිටා ක්‍රියා කිරීමය. දේව අම්මා මෙලොව දිවියේ දී ගෙදර දොර සියලුම වැඩ කටයුතු කළ අයුරු තම පුතුට සැමියාට අවශ්‍ය දේ සරිකර දුන් අයුරු හා ජේසු පුතාට ඒකාබද්ධව උන්වහන්සේගේ කාර්යයට උරදුන් අයුරු මෙනෙහි කළ යුතුය.

තමා පරිශුද්ධ වෙමින් අනිකා පරිශුධ කිරීමට යන ගමනේ දී අවැසි ජීවය ගැනීමට යාච්ඤා අත්‍යවශ්‍යය. ඒ සඳහා සේනා භටයාට ලැබී ඇති ශුද්ධ වූ ආයුධය ජපමාලයයි. ජපමාලය සමග තෙසාරා පත්‍රිකාවේ (අත්වැල යැදුම) සියලුම යාච්ඤා සැම මරිය භටයෙක්ම සති පතා රැස්වීම ආරම්භයේ දී උච්චාරණය කිරීමට බැඳී සිටී. ඒ අනුව සැම සේනා භටයෙක්ම රැස්වීම ආරම්භයේදීම පැමිණ සිටිය යුතුය. සේනා භටයන් පිළිපැදිය යුතු සැලකිය යුතු උපදෙස් අතුරින් පළමු වැන්නද එයයි. සේනාභටයන්ගේ ශුද්ධවන්ත භාවය ඇරඹෙන්නේ රැස්වීමේ ආරම්භක යාච්ඤාවෙනි. සැම සතියකම

යාච්ඤාව තුළින් ශුද්ධවන්ත භාවය ලබන සේනා හටයා පළමුව මීසම් ජනතාව සමග මුසු වෙමින් සැම පවුලක් වෙතම ජේසුස් වහන්සේව රැගෙන යමින් සැමගේ දුකට දොම්නසට සංවේදී වෙමින්, දේව අම්මාගේ බැගෑපත් ජීවිත රටාව තම ක්‍රියා කාරිත්වය තුළින් අන් අයට අවබෝධ කර ගැනීමට මං සලසමින් අපෝස්තලික සේවාවේ යෙදෙයි.

සතියට පැය දෙකක් සේවාවේ යෙදී සිටීම පරිත්‍යාගයේ පූර්වාදර්ශයකි. එසේම මීසම් පියතුමාගේ දැහැමියාවේ සේවාවට මුළුමනින් උදවු විය යුතු අතර එය වඩාත්ම තීව්‍ර කරමින් අත්පොත සටහන් කරන්නේ ''මරියතුමීගේ හටයා මීසම් පියතුමාගේ දිග හැරුණු දෙඅත් හා සමාන බවය.'' මීසමේ ජන ලේඛන සකස් කිරීම, දේව වන්දනාවට පූර්ණ අනුගතවීම, අඳුරේ සැරිසරන ජීවිත ආලෝකවත් කිරීමට පියතුමා යොමු කරවීම විශේෂ වේ. මෙවැනි කටයුතු කිරීමට භක්තිය හමුදා හටයාට අත්‍යවශ්‍යම ගුණාංගයකි. ඒ ගුණාංගය ගොඩ නැඟෙන්නේ දෙවියන් වහන්සේ කෙරෙහි ගැඹුරු විශ්වාසයක් උන්වහන්සේ තමන් වහන්සේගේ දරුවන් කෙරෙහි දක්වන ප්‍රේමයත් මරියහටයා අවබෝධ කරගත හොත් පමණි. එවිට උන්වහන්සේ අපේ පරිශ්‍රමයෙන් සතුටුවන බව අත් පොත මැනවින් පැහැදිලි කරයි. මෙසේ කටයුතු කිරීම තුළ ජේසු සමිදාණන් වහන්සේට ලෝකය දිනා දීමේ නොවරදින මාර්ගය මරියතුමී ලෝකයට පැමිණවීම බව ප්‍රත්‍යක්ෂවනු ඇත.

මෙවන් විශේෂ කටයුතු සම්භාරයක් කරමින් සියක් වසක් පුරා අඛණ්ඩව ගමනක් යාමට දේව අම්මාගේ මාතෘක මග පෙන්වීම හා රැකවරණය ලද බව සත්‍යයකි. එයට අමතරව හමුදාවේ නිර්මාතෘ ප්‍රැන්ක් ඩෆ් සොයුරු විසින් රචිත මරිය තුමිගේ හමුදා අත් පොත ද මහ පිටු බලයක් වීමද විශේෂය. පිටු 484 කින් ද පරිච්ඡේද 41 කින්ද උප ග්‍රන්ථ 11 කින් ද සමන්විත මෙය එක් එක් යුගවලදී සිටි සුදුතුම් පියවරුන්ගේ ප්‍රශංසාත්මක ලිපි සමුහයකින්ද පොහොසත්ය. මේ අත්පොත මරියතුමීගේ හටයා එතුමිය සමගත් එකිනෙකා සමගත් එකට බද්ධ කරන යදමක් වන අතර කවර තරාතිරමක අයකු වුවද අත්පොතට අවනත විය යුතු බව අවධාරණය කර ඇත. අත් පොතේ 20 වැනි පරිච්ඡේදය එය මැනවින් පැහැදිලි කරන්නේ මෙසේය. ''හමුදාවේ ක්‍රියාපරිපාටිය (ක්‍රියාපිළිවෙළ) වෙනස් කළ නොහැකිය.'' මේ පරිච්ඡේද අවසානයේ ඒ වැකිය මැනවින් විග්‍රහ කරන ගරු ජෝන් හෙන්රි නිව්මන් තුමා ප්‍රකාශ කරන්නේ නුඹලා මෙය මුළුමනින්ම භාරගත යුතුය. නැතහොත් මුළුමනින්ම ප්‍රතික්ෂේප කළ යුතුය යනුවෙනි. එසේම අත්පොත ආරම්භයේ දීම රෝමන් අංක xi පිටුවේ විචියර් කවියාගේ සංකල්පයක් උපුටා දක්වමින් සටහන් කර ඇත්තේ ''එක නූලක් බිඳින්න ඔබ දැලම විනාශ කරයි.'', ''දහසක් ස්වර අතුරින් එකක් බිඳින්න වේදනාවේ අම්හිරි ශබ්දය සැම ස්වරයක් තුළින්ම දිවයයි'' අත් පොතෙහි දක්වෙන ක්‍රමය ඒ අයුරින්ම පිළිගැනීමට සුදානම් නොමැති නම් කිසි විටකත් හමුදාවක් නොඅරඹන්න. යන්න අවධාරණය කරයි. පොතෙහි ඇති පරිච්ඡේද 41 න්ම දෙන උපදෙස් මෙසේ විධානයේ ස්වරූපයකි. 1927 දී ආරම්භ කරන ලද අත්පොත 1931 අවසන් කර ඇති අතර ප්‍රැන්ක් ඩෆ් සොයුරුගේ අත් දැකීම් රාශියකින් සමන්විත වීම හරි අගනේය. දැනට භාෂා 80 කට පරිවර්ථනය වී ඇති මෙම අගනා ග්‍රන්ථය 1947 දී සිංහලයට පරිවර්තනය වී ඇත.

මරිය තුමීගේ හමුදාව සිරිලකට සැපැත් වූ අයුරුද හරිම මනහරය. ස්වර්ගස්ථ අති උතුම් ජේ. ඒ. ගයෝමාර් නිමල මරිය නිකායික යාපනයේ රදගුරු හිමිපාණන් 1935 වසරේ මදුරාසියට ගිය අවස්ථාවේ දී සියැ සින් දුටු මරියතුමියගේ හමුදා හටසේවය ගැන අතිශයින් පැහැදී යළි දිවයිනට පැමිණෙන විට අත්පොතක්ද රැගෙනවිත් 1936 වසරේදී ජේ. ඒ. රාජනායගම් පියතුමා මඟින් පළමු මරිය හමුදා බීජය පාන්ඩියන්තල්වු සාන්ත ආනා දෙව් මැඳුරේ දී දමිළ බසින් ස්ථාපිත කර ඇත. මෙතැනින් සිරිලකට දොරගුලු විවර වූ මරිය තුමීගේ හමුදාවේ පළමු ඉංග්‍රීසි ප්‍රසීඩියම 1938 ජනවාරි 23 වන දින ශ්‍රී ජයවර්ධනපුර කොට්ටේ සාන්ත තෝමස් දෙව් විමනේ ඇරඹී අතර එහි ගෞරවය හිමි වන්නේ ගරු ඩබ්ලිව්. ඉසඩ් දබරේරා නි. ම. නි. පියතුමාටය. පළමු සිංහල ප්‍රසීඩියම බිහි කිරීමේ ගෞරවය සිරිලක පුංචි වතිකානය නමින් ප්‍රචලිත පමුණුගම පින් බිමටය.

1943 ඔක්තෝම්බර් 23 වන දින පමුණුගම මීසම්පති ගරු ලීනස් ද සිල්වා නිමනි පියතුමාගේ සුරතින් වේද සාක්ෂිවරයන්ගේ රාජේශ්වරියගේ

17 වන පිටුවට.....

**බෙනී ජයමාන්න**

පමුණුගම වේදසාක්ෂිවරයන්ගේ ප්‍රසීඩියමේ සාමාජික

## ගුරු මෑණියෝ

පියවරක් පියවරක් පාසා අප ගෙවූ මග
සවියයි මවුනි, ඔබ මට දුන් වදන් මග
වේවා මවුනි, ඔබ හට නිරතුරු සවිය
පිරිපුන් දිවිය තුළ වැජඹේ ඉදිරි මග

සාමාන්‍ය පෙළ පන්තියක ශිෂ්‍යාවන් දෙවසරක් සිය පන්තිභාර ගුරුතුමියව සිටි මා හට දුන් සමරු පොතෙහි, අද පැවිදි සොහොයුරියකව සිටින සිසු දියණියක සටහන් කළ වදන් පෙළකි ඒ.

තවත් ශිෂ්‍යාවකගේ මතකය මෙසේය; "ඔබතුමී අපට ඉගැන්වූවා ගුරුවරියක ලෙස; එක්ව සිටියා මිතුරියක් ලෙස; ආදරය දුන්නා මවක ලෙස".

ගුරුතුමියකට, 'ගුරු මෑණියෝ' ලෙස ඇමතීම දරුවන්ගේ හදවතින්ම එන ආමන්ත්‍රණයක් බව වටහා ගැන්මට තවත් අටුවා ටීකා කුමටද? සමරුව පුරා ලියවුණු වදන්, ගුරු මව් ස්නේහයට දරු සෙනෙහසින් ලැබුණු අවංක ප්‍රතිචාරයක් බැවින්, නිහතමානව සතුටු වෙමි.

මවක තමාට දැරිය හැකි උපරිම වේදනාව දරාගෙන මෙලොවට බිහිකරන දරුවා, මව්කිරෙන් පෝෂණය කරන්නේ මහත් ප්‍රේමයකිනි. දරුවා වැඩෙන විට ආහාරයෙන් මෙන්ම ගුණ දහමින්ද පොහොණි කරමින් යහපත් මනුෂ්‍යයකු සමාජයට දායාද කිරීමට වෙර දරන්නේ තම ජීවිත දෙවැනිකොට තබමිනි.

අම්මා එසේනම්, ගුරුතුමිය 'අම්මා' වන්නේ කෙසේද? තම කුසින් වැදූ දරුවන්ට මෙන්ම, සිසු දරුවන්ටද මවක ලෙස ආදරය, සෙනෙහස, දයාකරුණාව පාමින්, දැනුම මෙන්ම ගුණ දහමින්ද පෝෂණය කරමින්, ඔවා දෙමින්, ඔවුන් යහමඟට ගැනීමට ඇය අනන්ත කැපවීමක් කරන්නීය. උත්තම ගුරුවරයකුගේ භූමිකාව වන්නේ, සිසුවාව විෂය දැනුමින් පුරවාලමින් 'ලොකු ඔලුවක්' සෑදීම පමණක් නොව, යහපත් මනසක් මෙන්ම 'හොඳ හදවතක්' ද ඔහු හෝ ඇය තුළ නිර්මාණය කිරීමය. ජීවිතයට වටිනාකමක් දීමට උගන්වීමය. නැණ ගුණවලින්ද ප්‍රගුණ කර, ප්‍රඥාවන්ත මනුෂ්‍යයකු ලෙස සමාජයට මුදා හැරීමය. එසේ නොමැතිව, හුදෙක් තරඟයකට හුරු කිරීම නොවේ. තම ශිෂ්‍යයා, සමාජය සුවඳ කරන කුසුමක් බවට විකසිත කිරීම, ගුරු මෑණියන්ගේ එකම අභිලාෂයයි; එකම සතුටයි.

ගුරුවරියක්, දරුවන්ගේ ජීවිත ගමනට අත්වැලක් සපයන්නේ, හොඳ නරක පහදා දෙන්නේ, හැකි උපරිමයෙන්ම විෂය දැනුම ලබා දෙන්නේ, උසස් තත්ත්වයකට තම සිසු දරුවා පත්කළ යුතුය, යන යහපත්, අවංක චේතනාවෙන්මය. එලෙස ගත්කල, ගුරුවරිය වනාහි වචනයේ පරිසමාප්ත අරුතින් 'අම්මා' කෙනකු නොවේද?

පන්තියේ පළමුවැනියාට මෙන්ම අන්තිමයාටද සෙනෙහස පාන්නී ගුරු මෑණියෝ ය. පළමුවැනියාව තවත් ධෛර්යවත් කරමින්, අන්තිමයාවද නගා සිටුවන්නට ඇය වෙර දරන්නේ දයාව, කරුණාව, කැපවීම යන ගුණ ධර්ම මඟින්ය. ඔවදන් මෙන්ම දඬුවම්ද දෙන්නේ ද්වේෂයෙන් නොව ආදරයෙන්ම ය. දරුවකු සමාජයට පිළිලයක් වෙතොත්, එහි ප්‍රධාන වරදකරුවන්නේ අම්මා ය. ගුරු මෑණියන්ටද එම ආනිසංසයමය. සිසු දරුවකුගේ වරදකටද සමහරවිට පන්තිභාර ගුරුතුමිය හෝ ගුරුවරයා, විදුහල්පතිගේ දෝෂාරෝපණයට පවා භාජනය වේ. දරුවන් වෙනුවෙන් ගුරු මෑණියන්ගේ දෙනෙතට කඳුළු උනන අවස්ථාවකි ඒ.

දරුවකුගේ ප්‍රමුඛ ආදර්ශය අම්මා ය. එලෙසම දරුවෙක් තම ගුරු මෑණියන්වද ආදර්ශයට ගනියි. අනුගමනය කරයි. බොහෝ විට දරුවෝ තම ගුරුතුමියගේ කථා විලාසය, හැසිරීම, පෞරුෂය අනුකරණය කරමින් එම චරිතය රඟ දක්වති. ඒ ගුරු මෑණියන්ට ඔවුන් හදවතින්ම බැඳී ඇති හෙයිනි. රැකියාවක යෙදෙන මවකගේ දරුවකුට, දවසේ වැඩි කාලයක් ආදරය සෙනෙහස ලැබෙන්නේ ද, තම සිතේ තෙරපෙන ප්‍රශ්නයක් විසඳා ගැනීමට හැකිවන්නේද ගුරු මවගෙනි. දරුවාට සවන්දීමෙන් හා සංවේදී වීමෙන්, ගුරු මෑණියෝ ඔහුගේ හෝ ඇයගේ විශ්වාසය තහවුරු කරති. මෑතකදී, දහම් පාසල අවසානයේ දී මා ඇස ගැටුණු දසුනකි. ළදරු පන්තියේ දියණියක් අම්මා පැමිණ නැතැයි කියමින් හඬන්නීය.

ලාබාල තරුණියක වූ ඇගේ ගුරුවරිය, දරුවා වඩාගෙන තුරුලට ගත්තාය. ඇයගේ හැඬීම අඩුවිය. දහම් ගුරුවරියක වූ පළමු දිනයේම, ඒ යුවතිය නිරායාසයෙන්ම ගුරු මෑණියෝ වූහ. මව් සෙනෙහස අහිමි වූ දරුවන් ඒ ආදරය බලාපොරොත්තු වන්නේ ගුරු මෑණියන්ගෙන්ය.

ගුරු මවකට දරුවන් එක්කෙනකු හෝ දෙතුන්දෙනකු නොව ගුරු ජීවිතය පුරා දූ පුතුන් සිය දහස් ගණනකි. ඔවුන්ගේ සතුට දියුණුව බලා ගුරු මෑණියන් සතුට සැනසුම ලබන්නේ අභිමානයෙනි. එලෙසම ගුරුවරයකුගෙන් හැළී ගිය, සමාජයේ අයහපතට හේතු කාරක වන සිසුන්ද සිටිය හැක. එවැනි දරුවන් වෙනුවෙන් ගුරුතුමිය දුක්වන්නේ, ආදරවන්ත මවක් තම නොමඟ ගිය දරුවා ගැන හඬා වැටෙන ලෙසින්මය.

සමරු පොතෙහි තවත් පිටුවක් මගේ නෙත ගැටුණි. "මවුනි ඔබ සමඟ සතුටින් ගත කළ කාලය තුළ, අපට දුන් ඔවා රස; අප නිසා ඔබ නෙතට නැගුණු කඳුළු කැට, ඔබේ මාතෘත්වයට උපහාරයක්ම වේවා!"

**රූබි රුද්‍රිගු**
විශ්‍රාමික විදුහල්පතිනි
හපුගොඩ

සියවස... 15 වන පිටුවෙන්.....

නාමයෙන් බිහි වූ අතර ප්‍රසීඩියමේ ප්‍රධාන නියමුවන් වුයේ ඩබ්ලිව්. බී. බොතේජු සහ ඇම් ජෝසප් අන්තෝනි පෙරේරා යන ගුරු පියවරු දෙදෙනය. මේ ගුරු පියවරු දෙදෙනා රැස්වීම පවත්වාගෙන යාම සඳහා ඉංග්‍රීසි අත්පොතේ කොටස් සතියෙන් සතිය සිංහලට පරිවර්තනය කිරීමට කටයුතු කර ඇත. 1956 වසරේ පිහිටුවන ලද කනිටු ප්‍රසීඩියමේ ආරම්භක භටයකු වන බෙන්ජමින් කිරිහෙට්ටි සහෝදරයා අදටත් මේ ප්‍රසීඩියමේ අඛණ්ඩ සේවය කරන අතර තුඩැල්ල, කඳාන කියුරියාවල ප්‍රධාන නිලතල දරා කොළඹ ලංකා අප ස්වාමිදුවගේ කොමිට්සියම් සභාවේද ප්‍රධාන නිල හොබවා මරිය හමුදා දිවියේ 50 වන රජත ජයන්තියද පසුකර ඇත. කනිටු ප්‍රසීඩියමේ ආරම්භක සමාජිකයකු වූ ෆැන්සිස් කිරිඇල්දෙනිය සහෝදරයා ද විවිධ තනතුරු දරමින් සේවය කර ඇති අතර කොළඹ කොමිට්සියම් සභාවේ ද නිලධාරි සහෝදරයකුව සිට ඇති අතර දැනට සහකාර සාමාජිකයකු හැටියට සේවය කරයි.

සිංහල, දමිළ, ඉංග්‍රිසි භාෂා ත්‍රිත්වයෙන්ම සමන්විත මරියතුමිගේ හමුදාව අද වන විට සිරිලක සැම පදවියකම සක්‍රියව ක්‍රියාත්මක වන ප්‍රබල ගිහි අපෝස්තලික සංවිධානය බවට පත්ව ඇත. හමුදා ජීවිතය තුළ සැම දෙනම සහෝදරයා හා සහෝදරිය වෙති. විශ්වාසයේ ගමනක් යාමට කිතු ජනතාවට උගන්වන මරියතුමීගේ භටයා දේව අණ පිළිපදින, සභා නීතියට ගරුකර, විධානයට යටත්වන, අවනතවන, සභාව සමඟ එකට ගමන්කරන ක්‍රිස්තියානි ජීවිතය ජීවත් කරවන, එය අනිකාට උගන්වන, සැම සමඟ මිත්‍රශීලී ජිවිත රටාවකට මුසුවන, පළමු මිත්‍රත්වය දෙවිඳුන් සමඟත් දෙවනුව මිනිස් සංසය සමඟත් බෙදා ගන්නට ඇප කැප වී සිටී. කාලය යනු ජීවිතයයි. මරිය භටයෝ දසයෙන් භාගය ලෙසට මුදල් නුදුන්නත්, කාලය වැයකරමින් ජිවිතය කැප කරති. රෝගීන්, තනිවූවන්, පව්කාරයන් සොයා යමින් ද විශ්වාසය හැරගියවුන්, භේදභින්න වූ පවුල් සොයා යමින්ද, ඔවුනට සැනසුම දෙන්නට කැපවෙති. මේ තුළ ලබන්නා වූ සැනසුම පරලොව දක්වාම ගමන් කරන්නේ නොසිතූ ලෙසටය. මිලියන දහයකටත් අධික නූතන සෙබළ බල ඇණිය සැම වසරකම නොවැම්බර් මාසයේ දිව්‍ය පූජා මිලියන දහයකටත් වඩා ඔප්පු කිරීමේ වාසනාව ලබති. මේ නිසාම මේ සියක් වසර තුළදී ශුද්ධවරයට එසවීමට යෝජනා වී ඇති ෆ්‍රැන්ක්ඩෆ්, ඇල්පිලැම්බ්, එඩල් ක්වින් සහෝදර කැල මිලියන දහයකගේ යාච්ඤා බලය ලබනු ඇත. නුදුරු අනාගතයේ දී ශුද්ධවරයන් බිහි කිරීමේ පාසල මරියතුමීගේ හමුදාවයයි ප්‍රචලිත වුවද එය පුදුමයක් නොවේ. අවසන් කොට සැදැහැවත්නි, ඔබ තවම මරිය තුමිගේ හමුදාවට සම්බන්ධ වී නොමැති නම් සියක්වස සපිරෙන මේ මොහොතේ දී එයට සම්බන්ධ වී අනිකා පරිශුද්ධ කරමින් තමා ශුද්ධවන්ත වීමේ භාග්‍යය ලබන ලෙසට ආරාධනා කරමි.

# සොබාදම් මාතාව

"සොබාදහම යනු අපට මළගිය මුතුන් මිත්තන්ගෙන් උරුම වූ දායාදයක් නොව නූපන් පරපුරෙන් ණයට ඉල්ලා ගත් වස්තුවකි" 15 වන ශතවර්ෂයේ සිදුවූ යුරෝපීය ආක්‍රමණ නිසා, වඳ වීමට ලක් වූ ස්වදේශීය ඇමරිකානුවන් සොබා දහම සැලකුවේ එලෙසයි. පොළොවට පෙම් කළවුන්ගේ අවසානයත් සමග ශතවර්ෂ ගණනාවක් පුරා මිනිසාගේ ආකල්පය වී තිබුණේ තම පැවැත්ම උදෙසා සොබාදහම සමඟ නිරන්තර සටනක යෙදීමට අවශ්‍ය බවයි. ඒ අනුව ස්වභාව ධර්මයේ විවිධ අවයව වන ගුවන, ඇළ දොළ ගංගා, වනාන්තර, තුරුලතා, මුහුද යටත් කර ගැනීමටද, එමත සිය අණසක පිහිටු වීමටද තම අභිමතය පරිදි පරිභෝජනයට ගැනීමටද අපි හුරුවීමු. පරිසරයෙන් විවිධ දෑ උකහා ගැනීමේදී අප එහි සර්වබලධාරී නිර්මාණකරුවාද, අයිතිකරුවාද ලෙස කටයුතු කළෙමු, එලෙසින් සිදු කළ නොමිනිස් ක්‍රියාවල විපාකයද අද අපි ඇස් පනාපිටම අත්දකිමින් සිටිමු. යම් අනර්ථකාරී අහරක් ගත් විට එය අජීර්ණය වීම සිදු වන්නා සේ අපගේම විනාශකාරී ක්‍රියාවල ප්‍රතිඵල නැවත වැමැරීමට අපට සිදු වී ඇත. තම පැවැත්ම උදෙසා කළ යුත්තේ සොබාදහම සමඟ සටන් වැදීම නොව එය ආරාක්ෂා කරගැනීම බව නූතන මනුෂ්‍යයා පසක් කරගනිමින් සිටියි. ඒ අවබෝධය නිසාම වර්තමානය වන විට ලෝකයේ බොහෝ දියුණු රටවල් පරිසරය ආරක්ෂා කර ගැනීම වෙනුවෙන් විවිධ ක්‍රියාමාර්ග කරා යොමුව තිබේ. එවැනි රටවල් පරිසරයේ අගය වටහා දීම දරුවන්ගේ ප්‍රාථමික අධ්‍යාපනයේ අනිවාර්ය කොටසක් බවට පත් කර තිබේ. පරිසරය රැක ගැනීම වෙනුවෙන් ඉතා දැඩි නීති රාමුවක් ඇති කරගෙන ඇති අතර විධිමත් සංවිධාන ශක්තියකින් ඒ වෙනුවෙන් කටයුතු කරයි. විශේෂයෙන් ඕසෝන් ස්තරයට සිදුවූ හානිය අවම කරගන්නටද, ගෝලීය උෂ්ණත්වය පාලනය කරගනිමින් ඒ මගින් සිදුවන දුර්විපාක අවම කරගැන්මටද එක්සත් ජාතීන්ගේ සංවිධානය විශේෂ අවධානයක් යොමු කර තිබේ. ඊට අමතරව සමුද්‍ර ආරක්ෂණය, මුහුදු ජීවීන් හා පැළෑටි වඳ වී යාමෙන් මුදාගැන්මටද, කොරල් පර නැවත සිටු වීම වැනි දේ සඳහාද බොහෝ රටවල් නව මං සොයා ගනිමින් සිටී. ශ්‍රී ලංකාවේ සිංහරාජ වනන්තරය ඇතුළු ලොව බොහෝ වැසි වනාන්තර ලෝක උරුම ලෙස ලැයිස්තුගත කර ඒවා සංරක්ෂණය කරගැන්මටද, වඳවී යාමේ තර්ජනයට ලක්ව ඇති ජීවීන් හා දුර්ලභ ශාක විශේෂ ආරාක්ෂා කරගැනීම වෙනුවෙන්ද, ගෝලීය සංවිධාන පෙරමුණ ගෙන තිබේ. මෙවැනි පියවර ගැනීමට බොහෝ රටවල් ක්‍රියාකර ඇත්තේ පරිසරයට පුදන දේ නැවත සෘජුවම මනුෂ්‍ය වර්ගයා වෙත පෙරළා පැමිණෙන බව හොඳාකාරවම පසක් කරගෙන ඇති නිසාය.

බොහෝ දියුණු රටවල් සොබාදහම කෙරෙහි දැඩි සංවේදී ප්‍රවේශයක් පළ කර ඇති මොහොතක ශ්‍රී ලාංකික අපි තවමත් පරිසරය ආරක්ෂා කර ගැනීම අතින් ඉතා පසුගාමී තැනක රැඳී සිටිමු. දශක ගණනාවක් පුරා විවිධ රජය මගින් සිදු කෙරුණු අවිධිමත් සංවර්ධන ව්‍යාපෘති මේ සඳහා සෘජුවම බලපා තිබේ. පරිසර වාර්තා සහ ප්‍රාදේශීය ජනතාවගේ විරෝධය තණ සතයකට මායිම් නොකර විවිධ පටු ලාභ අපේක්ෂාවෙන් සිදු කෙරුණු මේ ව්‍යාපෘති තව දුරටත් රටේ සංවර්ධනය සඳහා දායක වනවා නොව රට වැසියන්ගේ සෞඛ්‍යයද පිරිහීමට ලක් කර ජනතාවගේ මුදල් කාබාසීනියා කරන මලපත් බවට පත්ව ඇත. නොරොච්චෝල විදුලි බලාගාරය නිසා කල්පිටිය අර්ධද්වීපයේ ජනතාවට විඳින්නට සිදුවීමට ඇති ගැහැට ඊට කදිම උදාහරණයකි.

ශ්‍රී ලංකාව දූපතකි; අප රට වටා ඇති මහගු සම්පතක් වන මහා සමුදුර අප ජීවිත සමග එකට ඇදී තිබේ. එබැවින් සමුද්‍ර ආරක්ෂණය කෙරෙහි ජනතාවගේ දැඩි සැලකිල්ලක් මෙන්ම දියුණු නීති රාමුවක් පැවැතීම අත්‍යවශ්‍ය කරුණකි. එනමුත් රටක් ලෙස එවැනි රැකවරණයක් අපි සාගරය වෙත සලසා තිබේද? සාගරය තරම් මිනිස් ක්‍රියාකාරකම් හේතුවෙන් දූෂණයට ලක් වූ තවත් ස්ථානයක් තිබේද කියා සැක සහිතවේ. ධනවත් නැව් සමාගම්වලට අනවශ්‍ය නැව් ගිනිබත් කර දැමීමට, අබලි ද්‍රව්‍ය හා විෂ රසායන තොග

ගිල්වා දැමීමට අප මුහුදු සීමාව ප්‍රයෝජනයට ගත් අවස්ථා පසුගිය වසර කිහිපයකදී අපි අත් දුටුවෙමු. දේශපාලුවන්ගේ නොමඳ සහයෝගයෙන් සිදු වන වැලි ජාවාරම නිසා විශේෂයෙන් මීගමුව හා උස්වැටකෙයියාවේ සිට පුත්තලම දක්වා සිදුව ඇති වෙරළ විනාශය මුදලින් තක්සේරු කළ හැකිද? වෙරළට සිදු කර ඇති හානිය හා අවභාවිතය නිසා ප්‍රාදේශීය ධීවර ජනතාවගේ ඉඩම් මුහුදු බාදනයට ලක්ව ඇති අතර ඔවුන්ගේ ජන ජීවිතයට එය විශාල තර්ජනයක්ව පවතී.

රජයේම සංඛ්‍යා ලේඛනවලට අනුව අප රටේ වන ගහණය සෑම වර්ෂයකදීම ක්‍රමයෙන් අඩු වෙමින් පවතී. වන විනාශය නිසා සිදුවන හානිය පිළිබඳ බලධාරීන් මෙන්ම පොදු ජනතාව තුළද තවමත් ඇත්තේ දැඩි අනවබෝධයකි. එනිසා වන විනාශය ඉතා ශීඝ්‍රයෙන් සිදු වූවත් එය රැක ගැන්මට පියවර ගැනීම ඉතා මන්දගාමීව සිදු වේ. වන විනාශයෙන් සිදු වන්නේ වෘක්ෂලතා නැති වී යාම පමණක් නොව එහි ඍජු හා අතුරුඵල ගණනාවකි. වර්ෂාපතනය හීන වීම, මිරිදිය ජලාශවල ජල මට්ටම පහත බැසීම, ඔක්සිජන් වායුව හිඟ වීම, පරිසර උෂ්ණත්වය ඉහළ යාම, භූගත ජලය සිඳී යාම හා කෘෂිකාර්මික ඉඩම් පුරන්ව යාම, වන ජීවීන් වඳ වී යාම ආදි දහසකුත් හානි කර දේ සමඟ වන විනාශය ඇඳී තිබේ.

රටක් ලෙස අපි තවමත් කසළ කළමනාකරණය අතින් සිටින්නේ ඉතා ප්‍රාථමික ස්ථානයක වෙමු. මෙහිදී අපගේ තත්ත්වය දිළිඳු අප්‍රිකානු රාජ්‍යවලින් කිසිසේත් වෙනස් නොවේ. කුණු කඳුවලට යට වී මිනිස් ජීවිත රාශියක් අහිමි වූයේ වසර කිහිපයකට ප්‍රථමයෙනි. එසේ තිබියදීත් මුදල් අපේක්ෂාවෙන් වෙනත් රටවල කසළ මිලදී ගැන්මට පවා අප රටෙහි දේශපාලකයන් කටයුතු කර තිබීම හාස්‍යයට කරුණකි. දියුණු රටවල කසළ ඔවුන්ට සම්පතකි. කසළ ප්‍රතිචක්‍රීකරණය කිරීමෙන් පවා ඔවුහු මුදල් උපයති. එහෙත් අප රටෙහි එකතු වන කසළවලට කුමක් කරන්නේද යන කරුණ පවා ප්‍රශ්නාර්ථයකි. ඒ වෙනුවෙන් ගෙන ඇති පියවර දෙස බලන කල සිනාසෙන්නද, හඬන්නද, යන්න පවා සිතා ගත නොහේ. විශේෂඥ උපදෙස් ලබාගෙන ප්‍රායෝගික විසඳුමකට එළඹීම පසක තබා ජනතා මුදල් බිලියන ගණනින් කාබාසිනියා කරමින් එපමණ අගයක්ම කොමිස් කුට්ටි ලෙස ගසා කමින් ක්‍රියාත්මක කරන්නට යෙදුණු අරුවක්කාරු කසළ ව්‍යාපෘතිය විවිධ පරිසර සංවිධාන, ආගමික නායකයන්ගේ හා ප්‍රාදේශීය ජනතාවගේ බලවත් විරෝධය හමුවේ තාවකාලිකව නතර වී තිබේ.

මේ වන විට සොබාදම් මාතාව තමන්ට අහිමි වූ යුක්තිය අපගෙන් ආයාචනය කරමින් සිටියි. එය නොලැබෙන තැනදී තමන්ට හිමි දේ බලෙන් ලබා ගැනීමට පවා ඇය කිසි සේත් මැලි නොවේ. අද අපි මුහුණ දී තිබෙන බොහෝ ස්වාභාවික විපත්තිවලට මුල්ව ඇත්තේ පරිසරය සමඟ අපි ඇති කරගෙන ඇති මේ අරෝවයි. මෙහිදී වසර කිහිපයකට පෙර හලාවත පදවි අපෝස්තලික පරිපාලක රදගුරු අති උතුම් වැලන්ස් මෙන්ඩිස් හිමිපාණන් පුත්තලම තබ්බෝව සිද්ධස්ථානයේදී ජනතාව හමුවේ කළ ප්‍රකාශයක් මගේ මතකයට නැගේ. උන්වහන්සේ ප්‍රකාශ කළේ මීට වසර 50-75කට පෙර තව නොබෝ කලකින් ජලය බෝතල් කර වෙළෙඳපළහි විකිණීමට තබා තිබෙන්නට හැකියාව ඇති බව යම් අයකු පැවසුවා නම්, එය විහිළුවක් ලෙස සිතා මිනිසුන් සිනාසෙන්නට ඇති බවයි. මන්ද එසමයෙහි අප ප්‍රදේශවල ජලය පිරිසිදු තත්ත්වයේ පැවැති අතර එහි හිඟයක් නොපැවතිණි. එහෙත් අද එය මුදල් ගෙවා මිලදී ගැන්මට සිදුව ඇති වෙළෙඳ භාණ්ඩයකි. එමෙන්ම උන්වහන්සේ අනාවැකි පල කෙරේ තවත් අවුරුදු 50කට පසු අප රට වැසියන්ට ඔක්සිජන් බෝතලය අතේ ගෙන රැකියාවට යාමට සිදු වුවහොත් තමන් වහන්සේ පුදුමයට පත් නොවන බවයි. එය චීනය, ඉන්දියාව ආදි රටවල විශේෂයෙන්ම වෙළෙඳ නගරවල මේ වන විටත් සැබෑවක්ව ඇති බව අපි දැනටත් දනිමු. අපද සිටින්නේ මේ තත්ත්වයට වැඩි දුරකින් නොවන බව අපි දනිමු. "තමාගේම සයනය

21 වන පිටුවට.....

**ගරු රොෂෙල් ගුරුසිංහ පියතුමා**
උල්හිටියාව, වෙන්නප්පුව.

# ඕං එහෙනං



අම්මා යන අකුරු තුනේ බල පිය පුතු සුදතුන් හට　　දෙවනා
අහස - පොළොව යා කළ දෙව් පුතු මෙලොව එළිය දුටු මරිමව්　　කුසිනා
විදු සාහිත ගුරු වෙද කම්කරු ගොවි විරුවෝ දුටුවේ මව්　　කුසිනා
එවන් උතුම් පදවිය මව් පදවිය දෙපා නැමඳ ගරු කළ　　යුතුනා

මැයි මස මල් මස මරි මස කියලා නැමඳූ ආදර මරි　　අම්මා
කුරුස මගේ නොහඬා දිරියෙන් දිරිදී පුතු මඟ ගිය　　අම්මා
කුරුසේ එල්ලී ඔබ පුතු අප පුතු සැමගේ මව් ලෙස කැපකළ　　අම්මා
ඔබ දරු කැල සුරකිනු මැන දහසක් දුක් දොම්නස්　　නිම්මා

නම මස කුස ගැබ සුරැකිව වඩවා මෙලොව එළිය දුන් මගෙ　　අම්මා
ලේ කිරි කර අත්පා සවිකර ලොවට මුදා හළ මගෙ　　අම්මා
මට ඇවිදින්නට අත් වාරුව වී ලොව සැරිසරනට දිරිදුන්　　අම්මා
දිවි හිමියෙන් ඔබ සුරකින්නෙමි මම වැඩිහිටි නිවසට නොදමමි　　අම්මා

මගෙ රට මව් රට මා ඉපදුණ රට ලොව දිනූ සිරිලක් මගෙ　　අම්මේ
එදා නිවටයෝ පරයාට ඔබ පාවා දුන්නා උන් ඔබ වැනසූවා මගෙ　　අම්මේ
වැව් දිය බැන්දා දාගැබ් සැදුණා ලොව විස්මිත කළ මගෙ　　අම්මේ
වීර පුතුන් සිල්වත් සඟුන් ඔබ මුදවා නිවහල් වූ　　අම්මේ

සුදු පිරුවට ඇඳ සාටක දාගෙන හෙළබස දොඩමින් පරයෝ අදත් එනවා　　අම්මේ
කීතු කීතු කර කැලි කඩාලා පරයාට දෙන්නට මාන බලනවා උන්　　අම්මේ
ඔබ දරු වත්කම් පොදි බැඳ ගුවනින් රට පටවනවා මගෙ　　අම්මේ
ඊට එරෙහි වූ ඔබගේ දරුවෝ ඔබ සුරකින්නට වීදි බහිනවා මගෙ　　අම්මේ

ඔබ අඩපණ කර ඔබ ගෙල සිර කර මරන්න හදනවා අපෙ　　අම්මා
රොත්ත පිටින් අල්ලා කුදලාගෙන ගෙන එන්නම් ඔබ වෙත　　අම්මා
ආයෙත් ඔබ සුනු විසුනු කරන්නට ඉඩ දෙන්නෑ අපෙ　　අම්මා
පරයන් පන්නමු දිවි ඇති තෙක් අපි ඔබ සුරකින්නෙමු අපෙ　　අම්මා

**සූරිය මාමා - ජෝසප් ඩයස්**

## අමිතගේ හද ගැස්ම......




**කලාපයෙන් කලාපයට භක්තියෙන් ප්‍රබෝධනයට ලියන චූටිකමට කියන කතා....**

## චූට්ටා

අපේ මිනිස් අම්මලා නපුරු උණත් අයහපත් උණත් තම දරුවන්ට යහපත කරන අය නම් අපේ දේව අම්මා ගැන කවර කථාද? එදා කුරුස පාමුල සිට දේව අම්මාව අපේ ම අම්මා කරමින් තෑගි ඔප්පුවක් පූජා කළේ ජේසුස් වහන්සේමය. එහෙම මැදිහත් වෙන්නට "දේව අම්මා" අප හා සමග සිටීම ගැන සැකයක් තිබිය හැකිද?

ඉතිං ඔයාලට කියන්න ගිය මාසයේ දී අපේ සිංහල ගුරුතුමිය දුන්න රචනාවක් ලියන්න කියලා අම්මා ගැන. ඔන්න ඕකයි මං ලිව්වේ. අපේ අක්කත් ටිකක් උදව් කළා තමයි. ඒත් මට නේ ලකුණු දුන්නේ ටීචර්. මට දහයෙන් දහයක්ම ලැබුණා කියන්නකෝ. මගේ රචනාවට මට මේ විදියට ලකුණු ලැබුණට ඉතිං මම දන්නව අපේ සමහර අම්මලාට නම් දහයෙන් එකක් වත් ලැබෙයි ද කියලා. අම්මාලාට ලකුණු දුන්නොත් හොඳ අම්මලාට ලකුණු දහයක් වුණත් ලැබේවි ඒත් නරක අම්මාලාට නම් ලකුණු බින්දුව තමයි. ඒ ඉතිං සුම්මලා හින්දනේ නේද?මං දන්නේ නෑ එව්වා මගේ රචනාව හොඳයි කිව්ව හින්දා මං ඔයාලටත් කියව ගන්න ඔන්න ලිව්වා අනේ මන්දා ඉතින් ...?

**ගරු තිලකසිරි ප්‍රනාන්දු පැ. තු. නි. පියතුමා**

සොබාදහම..... 19 වන පිටුවෙන්.....

මත පහරන කෙනකු වේද ඔහු නොබෝ දිනකින් හුස්ම හිර වී මිය යන බව" ප්‍රකට ගෝත්‍රික කියමනකි.

උද්ගතව ඇති තත්ත්වය හමුවේ අප ගත යුතු පියවර කවරේද? සොබාදහමේ විනාශය පිළිබඳ බලධාරීන්ට පමණක් ඇඟිල්ල දිගු කිරීම ගැටලුවට විසඳුම නොවේ. අවශ්‍ය වන්නේ සමස්ත ජන සමාජයේම සාමූහික ආකල්පමය වෙනසකි. පරිසරය ආරක්ෂා කර ගැනීම වෙනුවෙන් අවංකවම වුවමනාවක් අපට පැවැතිය යුතු අතර, එය තර්ජනයට ලක් වන අවස්ථාවල කොන්දේසි විරහිතව ඒ වෙනුවෙන් සටන් කිරීමටද ඉදිරිපත් විය යුතු වෙමු. මෙහිදී සොබාදහමේ වටිනාකම් හා අගයන් පිළිබඳව නිවැරදි සිතුවිලි අප දරුවන්ගේ සිත් තුළ රෝපණය කිරීම අනිවාර්යයෙන් සිදු විය යුතුය. රතු ඉන්දියානු නායක සියැටල් තම නිජබිම් අහිමිව යද්දී ආක්‍රමණික ඇමෙරිකානුවන්ට දුන් පණිවුඩය අප දරුවන්ටද අපටද වැදගත් වේ. "ජීවිතය නැමැති දැල මිනිසා විසින් වියන ලද්දක් නොවේ, ඔහු එහි නූල් පටක් පමණි. මිනිසා ඒ දැලට යම් හානියක් කරගතහොත් එය තමාටම කරගන්නා උපද්‍රවයකි".

# පුංචි විකුම්

## ළමා ප්‍රබෝධනය





පාස්කු කාලයේ පාදනමස්කාරය යෑම සාමාන්‍ය සිරිතයි. සෑම දෙව්මැඳුරකම පාහේ සිකුරාදා දිනවල පාදනමස්කාරය යන අතර, දෙව්මැඳුරේ සමිති - සමාගම් මඟින් එය සංවිධානය කෙරේ. එහිදී කුරුසිය රැගෙන යාම කෙරෙන්නේ වැඩි වශයෙන් පූජා උදවු සමිතිය මඟිනි. එක් සිකුරාදා දිනයක පාද නමස්කාරය සංවිධානය කර තිබුණේ විසෙන්ති පාවුලා සමිතිය මඟිනි. කුමන හේතුවක් නිසා හෝ එදින පූජා උදවු ළමයින් කිසිවෙක් පැමිණ සිටියේ නැත. පාදනමස්කාරය ආරම්භ කරන වේලාව කෙමෙන් ළංවී තිබුණද ඔවුන්ගේ හිඩැස වෙනස් නොවුණි. පියතුමා මහත් කේන්තියෙන් වටපිට බලන අයුරු දැකගත හැකි විය. කෙසේ නමුත් පාදනමස්කාරය ආරම්භ කිරීම සඳහා පැමිණ සිටි ළමයකුවත් ඉදිරිපත් නොවීම මහා ඛේදවාචකයකි.

වාසනා හයවන ශ්‍රේණියේ ඉගෙනුම ලබන ශිෂ්‍යාවකි. ඇය පාසැලේ මෙන්ම, දහම් පාසැලේද කැපී පෙනෙන දැරියකි. ඕනෑම කටයුත්තක් සඳහා නිර්භයව ඉදිරිපත් වීම ඇගේ සිරිතයි. ඉගෙනීමේ කටයුතුවලදී මෙන්ම බාහිර ක්‍රීඩා කටයුතුවලදී ද, සමිති සමාගම්වලදී ද නායකත්වය ගෙන කටයුතු කරන දැරියකි.

කුරුසය රැගෙන යාම සඳහා කිසිවකු ඉදිරිපත් නොවන බව දුටු වාසනා හතික ඒ සඳහා ඉදිරිපත් වූවාය. එසේම පාදනමස්කාරය අවසාන වන තෙක් ධෛර්යවත්ව කුරුසය රැගෙන ඇය ගමන් කළාය. බලා සිටි සැවොම විස්මිතව ඇයගේ මේ ක්‍රියාව දෙස බලා සිටියහ. මෙහෙය අවසානයේ පියතුමා ඇයට බෙහෙවින්ම ස්තුති කළ අතර, ඇයගේ ඒ ක්‍රියාව අගේ කළේය. එසේම මෙහෙයට සහභාගි වූ සැමදෙනාම කතා කළේ ඇයගේ නිර්භීත ක්‍රියාව ගැනය.

ආදර දුවේ පුතේ, යහපත් ක්‍රියාවක් සඳහා නායකත්වය ගැනීමට පසුබට වෙන්න එපා. ලජ්ජා වෙන්න එපා. එය ඔබගේ අනාගතයට ආයෝජනයකි. අනාගතයේ අපේ රටට අවශ්‍ය වන්නේ එවන් නායකත්වයකි. ඔවුන් බිහි වන්නේ ඔබ අතුරින්ය. එනිසා කුඩා කල සිට නායකත්වය ගෙන කටයුතු කිරීමට තරයේ සිහි තබා ගන්න.

**සූරිය මාමා**

# මිහිමඩලෙත්, අඳුරු කුසෙත් දිය උල්පත අම්මා

මෙලොව තුළ අති උතුම් ලෙස නම් ලද නාමයක් ඇත්ද, ඒ නාමය 'අම්මා' යන නාමයයි. මිනිස් සංහතිය පමණක් නොව දෙව් බඹ සේනා ද හිස නමන අති උසස් නාමය ද මෙයමයි. මුළු මහත් සමාජ තලයක්ම ඉදිරියට රැගෙන යාමට උර දෙන එකම කත 'අම්මා' යන උතුම් චරිතයයි. තම ශරීරය තුළ දිවෙන රුහිරය කිරි කර පොවා තම දරුවන්ව ආදරණීය ලෙස රැක බලා ගන්නා අති උත්තුංග චරිතය 'අම්මා' නම් වේ. තම දරුවන් වෙනුවෙන් මුළුමනින්ම ජීවිතය කැප කිරීමට සූදානම් එකම මහිලාව ඇයම වේ. ජීවිතයක් තුළින් තවත් නව ජීවිතයකට පණක් ලබා දී ඒ තිළිණය තම දිවිය පුරා රැක ගැනීමට වෙහෙස වන්නේ, 'අම්මා' නැමති උතුම් චරිතයයි. තම දරුවන් වෙනුවෙන් තම ආශා කැප කරන, කිසිදු ප්‍රතිලාභයක් බලාපොරොත්තු නොවී වෙහෙස වී තමන්ට පැවරූ කාර්යය අකුරටම ඉටු කරන, තම දරුවන් හට සැප පහසු ජීවිත දීමට දුක්බර දිවියක රස විඳින වර්තමානයේ යශෝධරාව අපේ අම්මා වේ.

දරුවන් වන අපගේ ජීවිත සමාජ තලයේ ඉහළ මට්ටම්වල බබළවන්නට වෙහෙස වන අපේ අම්මාට දරුවන් ලෙස දිය යුතු ගෞරවය, ආදරය අප නිසි ලෙස පුද කරනවාද? පුංචි කල පටන් අපට අකුරක් නැර කියාදී, කවා පොවා අපව සමාජයේ ඉහළ තැන්වල වැජඹවූ පසු අපගේ අම්මා විඳිනුයේ නිහතමානි සතුටකි. එහෙත් අද සමාජයේ බොහෝ විට සිදු වනුයේ දරුවන් දැනුමෙන් හා ශරීරයෙන් සන්නද්ධ වූ විට බොහෝ දරුවන් විසින් දෙමාපියන්ව මහලු මඩම්වල හා මහ මඟට ගොස් අත් හරිනුයේ ඔවුන් තම ජීවිත ජය මඟෙහි කොටස්කරුවන් බව නොසලකමිනි. එහෙත්, අම්මා යන චරිතය තම දරුවන් වෙනුවෙන් කරන කැපකිරීම වෙස්සන්තර ජාතකය ඇසුරින් ලියැවුණු කාව්‍යයක පහත ලෙස සඳහන් ය.

වදා වඩා රස කිරි දී ඇති කළදැයි පෙමිනේ
අඬා විඩා හැර පලවැල ගෙන දුන්දැයි නිතිනේ
වඩා මෙඅප වංකගිරිය ආ අම්මා සඳිනේ
වඩා සදෙව් ලොව සැප විඳ නිවන් දකින් සොඳිනේ

අම්මා අප වෙනුවෙන් කුසගින්න දරා, අපගේ කුස පිරවූයේ ඉතා ආදරයෙනි. ඒ ආදරය ඔබෙන් මගෙන් ඒ අම්මා නැවත බලාපොරොත්තු නොවූවත්, ඔබේ මගේ වගකීම අම්මා ඔබට මට දැක්වූ ආදරයම, ඊටත් වඩා වැඩියෙන් අම්මා හට දැක්වීමය. ඔබ මම සමාජයේ කෙතරම් ඉහළ ස්ථාන අරා උසස් වුවත් අපේ අම්මාට අපි ඇයගේ ආදරණීය දරුවන්මය. එසේ නම් අප කළ යුත්තේ කුමක්ද? මොහොතකට සිතන්න. ඇය දුෂ්කර මඟක ගමන් කර ඇය උත්සහ කරන්නේ අපව මල් යහනාවක සතපන්නටය. ඇය එම කාර්යය කෙසේ හෝ තම දරුවන් වෙනුවෙන් ඉටු කරන්නීය. එම මල් යහනාවේ සැතපෙන ඔබ - මම අපගේ මවගේ මහලු වියේදී ඇයව හොඳින් රැක බලා ගැනීම අප සැමගේ යුතුකම නොවන්නේද? අම්මා යන චරිතය තම දරුවන්ට දායාද කළ කිසිඳු දෙයකට කිසිදාක එම ණය ගෙවා දැමිය නොහැකිය. එසේ නම් 'අම්මා' යන උතුම් චරිතයට ගෞරවාදරය පුද කිරීමට පෙළගැසෙමු.

දුක් විඳ දසමස උසුලා වැදුදැයි අපෙ අම්මා
අඳුන් තෙලින් නිති සරසා ඇති කළදැයි අම්මා
රස පලවැල නෙලා දීදී රස්සා කළ අම්මා
සතර අපාවල නොයිපද නිවන් දකින් අම්මා

අම්මා අපට සැම විටම ලබාදෙනුයේ නිවැරදි හා හිතකර දේ පමණය. එලෙස අම්මා අප වෙනුවෙන් හොඳම දේ පමණක් ලබා දෙනුයේ ඇගේ හද ගැබේ ඇති දෝර ගලා යන මාතෘ සෙනෙහස නිසාය. අම්මා ඇගේ මුළු තරුණ දිවිපෙවෙතම තම ආදරණීය දරුවන් වෙනුවෙන්

29 වන පිටුවට.....

බුද්ධික සඳරුවන්
සා. අන්තෝනි සිද්ධස්ථානය, දළුපත

# මවක් නොවන මවක්



ලෝකයේ නොයෙක් දෙසින් සවන් වැකෙන ලොව අති සුන්දරම වූ උත්තරීතර වචනය වන්නේ "අම්මා" යන වචනය යි. එය සැබැවින් ම ලොව අති සුන්දර වූ අකුරු තුනක් එක් වීමෙන් සෑදී ඇති මේ 'අම්මා' යන වචනය තුළ සැඟවී ඇති ඒ උත්තරීතර මව් සෙනෙහසට වටිනාකමක් අත්කරදීමට මෙලොව කිසිවකුට නොහැකිය. සැබැවින්ම ඒ අම්මා යන වචනයෙහි සැඟවී ඇති ඒ උත්තරීතරභාවයට සමාන කළ හැකි එකම වස්තුවකුදු මේ මිහිමත නොමැත. තව දුරටත් එහි ගුණ ගැයීමට හෝ එහි ඇති ගුණ ලිවීමට හෝ සිංහල භාෂාව තුළ ඇති වචන ප්‍රමාණවත් නොමැති තරම්ය. සැබැවින් ම එහි ඇති උත්තරීතරභාවය 'කෙළවරක් නොවන සංසාරයක් වැනිය'.

ඒ උතුම් වූ 'අම්මා' යන වචනය තම දෙසවන් තුළ රැව්පිළිරැව් දෙන අයුරින් සවන් වැකෙනවාට ලෝකයේ සිටින සැම කාන්තාවක් ම ඉතාමත් ආසාකරති. එමෙන් ම ඒ උත්තරීතර වූ මව් පදවිය හිමිකරගැනීම සියලු කාන්තාවන්ගේ විසල් බලාපොරොත්තුවකි; අහිංසක සිහිනයකි; උතුම් පැතුමකි. එබැවින් ඒ 'අම්මා' යන වචනයට අනුව ඊට සමාන වූ 'අම්මා' කෙනකු වීමටද සැම කාන්තාවකට ම නොහැකි ය. එය වත්මන් සමාජ සංස්කෘතිය දෙස දෑස් හොඳින් විවරකර බැලුවකුට නොරහසක් ද වනු ඇත.

ඊට සිංහල සාහිත්‍ය ලෝකයේ දී නම් ඉතාමත් පැහැදිලි ම නිදසුනක්; හැඟීමක් ලෙස වත්මන් කාන්තාවන්ට දීමට 'හෙන්රි ජයසේන' සූරීන් සමත්වී ඇත. එනම් එතුමන් රචනා කොට නිෂ්පාදනය කරන ලද අපූරු වේදිකා නාට්‍යයක්වන "හුණු වටයේ කතාව" තුළ සිටින 'ගෲෂා'ගේ චරිතය ඇසුරිනි. 'ගෲෂා' ඒ නාට්‍යය තුළ දී සහෘද ප්‍රේක්ෂකයාට හමුවනුයේ මෙවැනි සැබෑම අම්මා කෙනකු ලෙස නොවුව ද ඇය ඒ තුළ මවක නොවන මවක වී තමන් හදාවඩා ගත් දරුවාට සැබෑ ම මව් සෙනෙහස ලබා දීමට සමත් වී ඇත. සැබැවින්ම ම ගෲෂා ඇයගේ ම කුසින් බිහි නොකළ දරුවකුට එතරම් සෙනෙහසක් දැක්වීමට තරම් වූ ඇයගේ හදවතේ වූ පිරිසිදු 'මව් සෙනෙහස නමැති නදිය' දසත ගලා යන ආකාරය ඒ නාට්‍යය නරඹන සියලු සහෘද ප්‍රේක්ෂකයන්ට සජීව ආකාරයට සිය හදවත තුළින් චිත්‍රරූප ආකාරයෙන් දැකගැනීමට හැකියාව ඇත. එය එතරම්ම සුන්දරත්වයකින්ද යුතු විය.

එලෙස සිංහල සාහිත්‍ය ලෝකයේ දී පමණක් නොව අප අපගේ ජීවිතය තුළ දුටු සැබෑ ම 'ගෲෂා' කෙනෙක්ද අපත් සමඟ ම සිටියි. ඇය අප කුඩා කාලයේ සිටම අප සමග ම සිටියා ය. ඇය කවුද යන්න අපට මෙන් ම ඇයව හඳුනන අයට ද නොරහසකි. ඇය වෙන කිසිවකුත් නොව පුරා වසර හතළිස් දෙකක් පුරා මා වැනි දියණියන් දහසකට ආසන්න වූ දියණියන් පිරිසකට නිහතමානව ඒ උතුම් වූ උත්තරීතර මව් සෙනෙහස මෙන් ම අපට අවශ්‍ය අධ්‍යාපනය, පෝෂණය, රැකවරණය මෙන් ම සාරධර්මවලින් ද අපව නිබඳවම පෝෂණය

කරමින් අපේ ජීවිතයට ඇතුළු ව අපේ ජීවිත එළිය කළ ගරු ක්ලැරින් කබ්රාල් පැවිදි සොයුරිය යි. ඇයගේ කුස තුළින් අප කිසිවකුත් මෙලොවට බිහි නොකෙරුවද ඇය අපට 'මවක නොවන මවක' වී අවසානය. එහෙත් ඇයගේ අසීමිත වූ ඒ මව් සෙනෙහස ඉදිරියේ තවදුරටත් ඇයව 'මවක නොවන මවක' ලෙසින් ම හඳුන්වාදීමට අප හදවත් කිසිම විටක දී අපට ඉඩක් නොදෙන්නේ ය. එනම් අප හදවත් සියල්ලම ඇයව පිළිගෙන තිබෙනුයේ අප සියල්ලන්ගේම සැබෑම "අම්මා" ලෙස වීම නිසාය.

සමාජයේ විවිධාකාර වූ ගැටලු හේතුකොට ගෙන සැබෑ ම මව් සෙනෙහස අහිමි වූ දහසක් දියණියන්ට ජාති ආගම් කුල යනාදි කිසිවක් බාහිර හෝ අභ්‍යන්තර බාධාවක් ලෙස නොසලකමින් ඒවා 'අලුයම ලූ කෙළ පිඬක් සේ' ඉවත දමා අප සියලුදෙනාට සමසේ බෙදා දෙන ඒ උතුම් වූ උත්තරීතර මව් සෙනෙහස අප අපගේ නෙතින් දුටු විස්මයජනක ම වූ උතුම් ම මව් සෙනෙහසයි. එවන් අත්‍යුදාර වූ මව් සෙනෙහස විටක සැබැවින් ම වත්මන් සමාජයේ සියලු ම කාන්තාවන්ට තමන් කවුරුන්දැයි නිවැරදිව හඳුනා ගැනීමට සුදුසු ම කැඩපතක් විය. එපමණක්ද නොව ඇගේ එම ජාති ආගම් කුල භේද නොමැති පිරිසිදු ආදරය තුළින් "මවක තම දරුවා මව් කිරෙන් පෝෂණය කරන්නාක් මෙන්" ඇය අපව සාමය නමැති මව් කිරෙන් අප හදවත් පෝෂණය කරන්නී ය.

අපගේ ජීවිතයේ අප අකුරු කරණයේ සිට අප ජීවිතයේ ලබන සොඳුරුත ම අවස්ථා වන අප වැඩිවියට පත්වීමේ සිට අපගේ විවාහය දක්වා වූ සියලු ම අවස්ථාවලදී ඇය අපට අපගේ ම සැබෑ ම අම්මා ලෙස අප සමඟ ම වූවා ය. ඇගේ ජීවිතය තුළ දී ඇය මවක නොවන මවක් වී ඇය සිදු කරනු ලබන මේ සියලු කැපකිරීම් ඇය විසින් සිදු කරනු ලබනුයේ හද පිරි සතුටකින් වන බව ඇයගේ මව් සෙනෙහසින් ආඪ්‍ය වන ඇයගේ ම ආදරණීය දියණිවරුන් වන අපට කිසිවිටක නොරහසක් විය.

දියණියකට තම ජීවිතයේ දී තමන්ට ම විශේෂ වූ එවැනි අවස්ථාවල දී සැබැවින් ම තම සැබෑ ම අම්මාගේ ඒ උතුම් වූ උත්තරීතර ආදරය, රැකවරණය, පෝෂණය මෙන් ම අවවාද අනුශාසනා ලැබිය යුත්තක් ම විය. එහෙත් ඒ සැබෑ ම මව් සෙනෙහස අහිමි අපට ඇය සැබෑ ම 'අම්මා' ලෙස අප ළඟින් ම සිටියේ අපේ සිතට ඒ අඩුව නොදැනවීමට මෙන් ම ඒ අඩුව හේතුවෙන් අපේ නෙත් තුළ පිරෙන කඳුළු බින්දු නවතාලන දැවැන්ත පවුරක් ලෙසිනි. එමෙන් ම ඇය අපගේ සැබෑ ම අම්මා පිළිබඳව කිසිදු වෛර සහගත ද්වේෂ සහගත සිතුවිලිවලට අපේ සිත් ඩැහැ ගැනීමට ද ඉඩක් ලබා නොදීමටද ඇය බෝහෝසෙයින් වග බලා ගත්තා ය. මෙහි දී අපේ ජීවිතය රැක ගන්නා විසල් පවුරක් ලෙසින් ඇයව හඳුන්වාදීමේ දී අපේ මතකයට නැගෙනුයේ සිංහල සාහිත්‍ය ලෝකයේ සිටි කාව්‍යකරණයෙහි ලා දස්කම් දැක් වූ අති දක්ෂ භික්ෂූන් වහන්සේ නමක් වන වෑත්තෑවේ හිමියෝය. උන්වහන්සේ විසින් රචිත 'ගුත්තිල කාව්‍යය' තුළ දී අපට හමුවන 'බරණැස් නුවර වැනුම' තුළ දී උන්වහන්සේ ඉතාමත් අපූරු පද්‍යයක් රචනා කර ඇත. ඒ මෙස්ය,

"දුසිරි නවතා දෝ - පිරිතිරෙන ඉසුරටදෝ
ඉදිකළ මෙන් සොදෝ - බැබළි එපුරෙහි පවුර කළදෝ"

මෙහි දී උන්වහන්සේ පවසා සිටිනුයේ ඒ බරණැස් පුර නුවර දුසිරිත්වලින් රැකගැනීමට හා එහි ඇති වස්තු සම්පත් හොරුන්ගෙන් සහ මංකොල්ලකරුවන්ගෙන් රැක ගැනීමට මහා බ්‍රහ්මයා විසින් නුවර වටා විසල් පවුරක් ගොඩනැගූ බවයි. එය මෙහි දී මා දක්වා සිටියේ අපට මෙලොව මවක නොවන මවක වූ කන්‍යා මව් තුමිය අපගේ ද ජීවිතය හා සිත් රැක ගැනීම සඳහා මෙන් ම ඇය අපට නිරතුරුව ම බෙදා දෙන ආදරය හා රැකවරණය කොතරම්ද යන්න පැහැදිලි කිරීම සඳහා ය. එවන් විසල් පවුරක් වී අපේ ජීවිතවලට බාහිරින් පැමිණෙන

අයහපතට අපව බිලි ගැනීමට ඉඩ නොදී ජීවිතය පමණක් නොව සාරධර්මවලින් ආඪ්‍ය වූ අපේ සිතද රැකගැනීමට සමත් වූ ඇගේ උත්තරීතර ආදරය ඉදිරියේ ඇයව 'මවක් නොවන මවක්' ලෙස ලෝකයට හඳුන්වාදීමට අප කිසිවෙකුට නොහැකිය. එහෙත් ඇය අප සියලුදෙනාගේ ම සැබෑ ම මව්තුමිය ලෙස ලෝකයට හඬගා කියන්නට අපි සැවොම අපේක්ෂාවෙන් සිටිමු.

දිවා රාත්‍රී නොබලමින් අපගේ සියලු අවශ්‍යතා අප වෙත සපුරා දෙන ඇයගේ මහාත්මා ගුණය මෙලෙස කිසිවකුට සමකල නොහැකිවනවා සේම ඇයගේ ඒ සුපිරිසිදු මව් සෙනෙහස වත්මන් සමාජයේ සියලු ම කාන්තාවන්ට ඒ උතුම් වූ උත්තරීතර " මාතෘත්වයේ අගය" නමැති පාඩම ප්‍රායෝගිකව ම සිදුකරමින් උගන්වන ගුරුවරියක වැනි ය.

එපමණක් ද නොව ඇය මෙන් 'මවක නොවන මවක' වීමට සිහින සිතුවම් අඳින සමාජයේ සිටින වෙනත් ආදරණීය මව්වරුන්ගේ ඒ සිහින සිතුවම් ඇය සේයා කරනුයේ එවැනි සිත් තේරුම් ගත්තාක් මෙනි. එලෙස වෙනත් අම්මා කෙනකුගේ සිහින සිතුවම් ඇය සේයා කළ ද ඉන් ඇයගේ සිතුවම තුළ ඇති පාට බොඳ වී ගිය ද ඇය ඉන් නොසැලී සිටියා ය. ඇයගේ සිහින සිතුවමේ ඇති පාට අප සියලුදෙනා වුව ද අපගෙන් වෙනත් මවකගේ සිහින සිතුවමක් සේයා කරන ඇගේ සිහින සිතුවම බොඳවී යන විට දී ඇතැම් විට ඇගේ නෙත් තුළ කඳුළු බිඳු පිරුණේ ක්ෂණයකින් වුවත් ඇය එම කඳුළු බිඳු අපට හොරෙන් ක්ෂණයකින්ම සඟවා ගත්ත ද අප ද ක්ෂණයකින් ඇය සඟවා ගත් කඳුළු බිඳු දුටුවේ දියෙහි ඇඳි රේඛාවක් මෙනි. එහෙත් ඒ කඳුළු බිඳු හදවත ඇතුළින් හදවත පුරා ගලායන විට දී ඇගේ හදවත, හදවතින් දකින අපට ඇය ගැන දැනෙන ඒ ගම්භීරත්වය, ඒ ආඩම්බරය අපගේ ජීවිතයට ද එක්කර ගැනීමට අපි කිසිවිටක උදාසීන නොවුණෙමු.

ඇතැම් විට අප අපේ අධ්‍යාපන කටයුතු අවසන් කිරීමෙන් පසු ජීවිත ගමනේ ඉදිරියට යන මාවත කුමක් දැයි අපට නිවැරදිව ම පෙන්වා දීමට සමත් වනුයේ සැබැවින් ම ඇය අපේ "ජීවන යාත්‍රාවේ කපිතාන්වරිය මෙනි". අපගේ ජීවිතයේ අනාගත සිහින සිතුවම් සේයා කිරීමට අපට අපේ ළඟින් ම සිට අපට උගන්වන ඇය විටක අප සැමට "ගුරුවරියක්" ද වූවා ය. අධ්‍යාපනය පමණක් ම නොව කාන්තාවකට තම ජීවිතයේ ආභරණයක් බඳු වූ පිරිසිදුකම, පිළිවෙළ, යහපත් සෞඛ්‍ය පුරුදු, ගෙවත්තේ වැඩකටයුතු ආදි තවත් බොහෝ දේ ගුරුමුෂ්ටියකින් තොරව අපට උගන්වන ඇය විටක සැබෑ ම ගුරුවරියක් මෙන් ම ජීවිත උපදේශිකාවක් ද වූවා ය.

ඇතැම් විට අප ජීවිතයේ වැරදි මගක ගොස් අප අතරමං වී සිටින විට අප ගමන් ගත් මග දිගේ අප සොයා පැමිණ අපගේ හදවත නමැති අතින් අල්ලා අපව නැවත නිවැරදි මගට කැඳවා ගෙනැවිත් එහි ඉදිරියට ම අපව යවා ජයග්‍රහණය වෙත ළඟා කොට ඒ ජයග්‍රහණය අප ලැබූ පසු ඇය නිහතමානව විඳගත් ඒ සතුට තුළ අප දුටු ඒ මහාත්මා ගුණය ඇතැම් විට සැබෑම මවකගේ ආදරයට අභියෝග කළ හැකි තරම් ය.

එපමණක් ද නොව තවමත් ළමයින් වන අප අතින් සිදුවන විවිධ වැරදිවල දී ඊට සරිලන තරම් කුඩා දඬුවමක් දී අපට අපගේ වරද පෙන්වා දී අපව නිවැරදි දෙයට හුරුකරවීමට ඇය දැරූ උත්සාහය අති මහත් ය. ඇගේ එම උත්සාහය නැමැති මහා වෘක්ෂයේ හටගත් එල අතර පලබරින් වැඩි විපුල එල අප්‍රමාණව ඇත. ඇය පෙන් වූ මග ගමන් කර අනාගතය ගොඩනගා ගත් අප වැනි වැඩිහිටි සහෝදරියන් බොහෝ දෙනෙක් වත්මන් සමාජය තුළ තම ජීවිතය කිසිවකුට කරදරයක්, හිංසාවක්, පීඩාවක් නොවන අයුරින් ගොඩනගා ගත් අය මෙන් ම අධ්‍යාපනය තුළින් ගමන් කළ හැකි උපරිමය දක්වා ගොස් අධ්‍යාපනය, ඉගෙනීම නැමැති ශුෂ්ක වූ මහා කඳු හෙල් නැග එහි මුදුනෙහි සිටිමින් එහි මුදුනට නැගීමට උත්සාහ කරන වැටි වැටී නැගිටින ආකාරය එහි මුදුන සිට දකින ඔවුන් අප

වෙත ඔවුන්ගේ ජයග්‍රාහී සුරත් දිගු කොට අපව ද එම කඳු මුදුනට පිළිගැනීමට අපේක්ෂාවෙන් පසුවෙති. මේ සැම ජීවිත ජයග්‍රාහකයකු ම අපගේ ආදරණීය පැවිදිසොයුරියගේ නැතහොත් අපට 'මවක නොවන මවක' වූ අපගේ සැබෑ අම්මාගේ උත්සාහය නැමැති මහා වෘක්ෂයේ හටගත් පලබරින් වැඩි විපුල ඵලයි. වත්මනේ අපට මෙන් ම ඇයව හඳුනන කිසිවකුට ද එය නොරහසකි.

සැබැවින් ම ඇය ඇයගේ ජීවිතයේ, වත්මන් කාලය තුළ 'මවක නොවන මවක' වී කරන්නා වූ මේ මහගු සේවය සමකිරීමට කිසිවක් මේ මිහිමත නොමැති තරම්ය. ඒ සේවය තුළ ඇයගේ ගුණ ගැයීමට, ඇයගේ ගුණ ලිවීමට හෝ අපට අපේ භාෂාව තුළ පමණක් නොව කිසිදු භාෂාවක ප්‍රමාණවත් තරම් වචන නොමැති තරම්ය. එතරම් වටිනා ඇයගේ සේවය සමාන කළහැකි දෙයක් නොමැති වීමත් ඇයගේ ගුණ ගැයීමට ප්‍රමාණවත් වාග් මාලාවක් අපට නොමැති වීමත් සැබැවින් ම අප සැමගේ සිත්වලට මහත් වූ කනගාටුවකි. එහෙත් එය පසක්කර ගැනීමට අපට තරමක් හෝ පහසුවක් ලැබෙනුයේ ඇයව අප 'මවක් නොවන මවක්' ලෙසට නොව ඇය අපේ ම අම්මා ලෙස අප සියලු දෙනා එක්ව පිළිගැනීම තුළිනි. එය සැබැවින් ම අප සැමට ම එක්ව කළ හැකි ඉතා පහසුම ක්‍රියාවකි.

ඒ අනුව ආදරණීය 'අම්මේ' ඔබයි මේ මිහිමත සිටින අම්මාවරුන් අතර මිණි ඔටුන්න හිසදරා සිටින අග රැජින. 'මවක නොවන මවක' වීමට සියලු කාන්තාවන්ට ඔබගේ චරිතය සැබැවින්ම අභියෝගයක් වේ. ඇයගේ ආදරණීය දියණියන් වන අපි සියලු දෙන එක්ව මවක වීමට සිහින සිතුවම් අඳින සිහින සිත්තරාවියන් හට ගෞරවයෙන් යුතුව ආරාධනා කර සිටිමු.

**ආශා සෙව්වන්දි**
13 වසර, ශු. විසෙන්ති නිවාසය, රත්නපුර

## මැරිස් ස්ටෙලා විදුහලට වසර සියය සපිරේ

මීපුර හොබවන
දන මන පොබයන
මාරිස්ට් තුම් විදු පියස අපේ
සියවස් සපුරන අබිමන් පාමින
අද නිම්නැති බැති පෙමින් පිපේ

මෙතුවක් ආ මග දෙස
නෙත් හෙළුවොත්
දිස්වේ දෙවිඳුන්ගේ අනුහස්
මරිය මවුන්ගේ බැල්ම නිබඳ ලත්
නිම් නැත මෙහි ගලනා විදු රැස්


සුවහස් සිසු මන
ගුණ නැණ කැල්මෙන්
දිදුලන වරමක් දෝත දරා
සුදුවර මාර්සලින් මහිමෙන්
වී පණවත්
මාරිස්ට් ධජය ලෙළදේ
දෙරණ පුරා

සදහම් සුවඳත් ගුණදම් අවියත්
රන්මිණි තරු මේ ලොවට බෙදා
මාරිස් නාමෙන් නොමැකෙන එළියක්
පැවා මේ මුළු දෙරණ පුරා

ස්වර්ණ ජයන්තිය සමරන මෙදවස
මරිය එළිය දිවමන්ව පෙනේ
උදාන ගී මේ එතුමියට පුදනකොට
සැනසෙන විට අම මිහිර දැනේ

**ගරු චාමර හෙට්ටිආරච්චි සහෝදරතුමා**
මාරිස්ට් සහෝදර නිකාය

## ප්‍රහේලිකා අංක - 67




**හරහට**

1. ලෝ ප්‍රසිද්ධ "අම්මා" ග්‍රන්ථය ලියූ කතුවරයා.
5. දේව මාතාවන්ට කැපකළ සිද්ධස්ථානයකි.
7. ඉරට සමාන වචනයකි.
9. "උතුම්" යන්නට සමාන වචනයකි.
11. එක්සත් ජනපදයේ විශාලතම දූපත.
12. වටින ලෝහයකි.
13. ගවමහිෂාදීන්ගේ හිසින් ඉදිරියට නෙරා එන දැඩි කෝටින් විරූහණය.
14. කල්පිත සත්ත්වයෙකි.
15. කුළු බඩුවකි.
17. ජලය දැමීම සඳහා භාවිත වන භාජනයකි.
20. එහා මෙහා පෙනෙන.
21. දේව මෑණියෝ ................ ලෙසින් දරු අපගේ අවැසිතා බලා දෙවි පියාණන් ඉදිරියේ අප වෙනුවෙන් අයදිති.
22. දේව මෑණියෝ ................ කුමරිය ලෙසද හැඳින්වෙති.
23. ශ්‍රී ලංකාව මේ වන විට මුහුණ පා ඇති අර්බුදයකි.
24. අගෝස්තු 15 සමරනු ලබන්නේ දේව මාතාවන්ගේ ................ මංගල්‍යයයි.

**පහළට**

1. මැතිවරණ පිළිබඳව පූර්ණ බලතල ඇති ප්‍රධාන නිලධාරියා.
2. නෙළුම් මලට තවත් නමකි.
3. ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයකි.
4. මවගේ ලේ, දරුවන් වෙනුවෙන් මෙසේ විය.
6. මැද පෙරදිග රාජ්‍යයකි.
8. කුරුල්ලන් හා සම්බන්ධ.
10. දෙවියන් මගින් බලය ලැබීමක් මේ නමින් හැඳින්වේ.
15. සාහිත්‍ය අංගයකි.
16. ශරීර අංගයකි.
18. "මේ වනතුරු" යන්න සමාන අරුත් දේ.
19. "සිරි .......... පිරි අවුරුදු සිරි"
20. ......................... බුද්ධිය.
23. "උර ගා" යන්නට සමාන අරුත් දේ.

සැකසුම :

**ගරු චාමික සුදර්ශන නි. ම. නි. පියතුමා**

ප්‍රහේලිකාව සඳහා ඔබගේ පිළිතුරු තැපැල්පතක පමණක් ලියා පහත ලිපිනයට, **2022 මැයි 31** ට පෙර තැපැල් කරන්න. ජයග්‍රාහකයන් අතුරින් තෝරා ගත් **තිදෙනකුට** මුදලින් තෑගි පිළිවෙළින්, රු.1000.00, රු.750.00, රු.500.00 බැගින් පිරිනැමේ.

***විශේෂ මතක් කිරීමක් - ප්‍රහේලිකාවේ විසඳුම් එවන විට ඔබේ නම, පන්තිය, පාසල, පාසලේ සහ නිවසේ ලිපිනය සඳහන් කර එවන්න.***

ප්‍රහේලිකා අංක - 66
"ළමා භක්ති ප්‍රබෝධනය",
අංක 265,
ඩීන්ස් පාර, මරදාන,
කොළඹ 10.

**ප්‍රහේලිකා අංක 65 කිසිවකු ජයග්‍රහණය කර නැත.**

# මොනවද අම්මේ අකුරු ජාතියක්



මොනවද අම්මේ අකුරු ජාතියක්
මල් පෙතිවල කවුදෝ ලියලා
කවුරුද අම්මේ මේවා ලියන්නේ
පාට පාට ඉරි හැඩ ගහලා

පුතා දන්නෙ නෑ හඳ ඇති කාලෙට
වනන්තරේ හරි වැඩ කෙරෙති
බෝසත්වරු බණ කතා කියද්දී
වන දෙවඟනො මල්වල ලියති

මේ වගෙ ලස්සණ පාට අපට නෑ
කොතැනින් මේවා ගෙන එන්නේ
කොහොමද අම්මේ මේව ලියන්නේ
මට නෑ මොකවත් තේරෙන්නේ

ඉර පායන කොට ඉර බැස යන කොට
පාට වලාකුළු ඇත අහසේ
ඒවායින් මේ මල් පැහැ ගන්වයි
ඒව කෙරෙන්නේ හොර රහසේ

අම්මෙ අම්මෙ අර පුංචි කුරුල්ලෝ
කිචි බිචි ගා මොනවද කියති
උන් දන්නව ඇති මේ මල්වල ඇති
පුංචි අකුරු නිතරම බලති

ඔව් මගෙ සූකිරි පුංචි පුතේ ඔව්
කුරුලු ගීතවල රස මතුවේ
එක එක තාලෙට කියන කියන දේ
මල් කොළවල තව තව ලියැවේ

බිම බැලුවත් මල් උඩ බැලුවත් මල්
පුංචි කුරුල්ලන් ඉගිලෙනවා
සැමදාම ඇයි මෙහෙමම නැත්තේ
මන්ද කුරුල්ලන් කොහි යනවා

බුදු හාමුදුරුවො ඉපැදුණු කාලෙට
කවදත් ඔහොමයි පුතුනි මගේ
මිනිසුන් වාගෙම සත්තුන් වාගෙම
මල් කොළවලටත් සතුට නැගේ

අම්මේ අර අප සාදු කියනකොට
බුදු හාමුදුරුවෝ මල් දැකලා
දුටුවද ටික ටික හිනැහෙන ලස්සණ
ඉස්සර කිවු බණ මතක් වෙලා

වසර හැත්තෑවකට පමණ ඈතට දිව යන ඉහත ගීතය ගුවන් විදුලියෙන් අසන්නට ලැබුණ පැරණි ගීත අතර ප්‍රකටය. කිංස්ලි ජයසේකර සහ ප්‍රිසිලා ඕපාත ගායනා කරන මේ ගීතය සංගීතවත් කරන්නේ කිංස්ලි ජයසේකරය.

දයාබර මවක තම පුංචි පුතු සමග ඇතිවන දෙබසක් ඉතා සරල අයුරින් ගීත රචක චන්ද්‍රරත්න මානවසිංහයෝ අපූරුවට මතු කරති.

පුංචි පුතා විවිධාකාර ප්‍රශ්න තම මෑණියන්ගෙන් අසයි. මල්, කුරුල්ලෝ, සමනලයෝ, වගේම පරිසරය පිළිබඳවත් මේ දරුවා අනර්ඝ අයුරින් ප්‍රශ්න අසයි. අම්මා දන්නා ආකාරයට රසවත් කතාන්දරයක් අයුරින් පුංචි පුතාට කියා දෙන්නීය. කොච්චර ලේසිද දරුවට අම්මා කියන විදියට තේරුම් ගන්න. බස්වල, කෝච්චියේ, මග තොටේ ගමන් කරද්දි දරුවෝ කී දෙනෙක් අද

31 වන පිටුවට.....

ගරු එමාඩ් දල්පතාදු නි. ම. නි. පියතුමා

# ඔබෙ ගුණ කීමට හෝඩියෙ අකුරු මට මදී

වේදනාව කැටිකරගෙන කඳුළු මැදින්
සිනාසෙන්නෙ අම්මා
සියලු දෙනා හැර යද්දී තනි නොකරන්
ළඟින් ඉන්නෙ අම්මා
බත් පිඟාන හිස් වෙද්දී ඇගෙ පිඟාන මටම
දෙන්නෙ අම්මා
අන් හැමෝම නිදි කිරද්දි මා ළඟින්ම නිදි
මරන්නෙ අම්මා
වැරදි කරල කොන් වෙද්දී අතැර නොයා
ළඟින් ඉන්නෙ අම්මා
සවස් වෙලා රෑ වෙනකල් මං එනතුරු
බලන් ඉන්නෙ අම්මා
ගඟට උඩින් කොක්කු යවල නිදි යහනට
මා යවන්නෙ අම්මා
ලේ කිරි කර කවා පොවා හිටගන්නට පණ
දෙන්නේ අම්මා
අත් දෙක පොඩි එකතු කරන් වඳින අයුරු
පෙන්න දුන්නෙ අම්මා
ආදරයේ අකුරු හතර ජීවිතෙන්ම
කියාදෙන්නෙ අම්මා
උදාරයි, උදාරයි, උදාරයි ආදරේ....

**ගරු විලියම් ඉවාන්ස් ලියනාරච්චි පියතුමා**
අදියුරු
සා. ඇලෝසියස් දෙව්සත්හල, බොරැල්ල

## ප්‍රහේලිකා අංක 65 - පිළිතුරු

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 1 ච | ණ් | 2 ධා | ල | | 3 ත්‍රි | | 4 කැ | | 5 වි |
| ක්‍ර | | වි | | 6 ස | මා | න | ත් | ව | ය |
| 7 ව | ස | න් | 8 ත | | ණ | | ත | | ද |
| ර් | | | 9 රු | ව | | 10 ච | | 11 දා | ම් |
| 12 ති | ස | 13 ර | ණ | | | රි | | | |
| | | ස් | | 14 ජී | වි | ත | ය | | 15 වි |
| 16 ග | බ් | සා | 17 ව | | | ය | | | වා |
| ඟ | | 18 ව | ය | ස | | | 19 බ | | හ |
| 20 කි | වී | | ඹ | | 21 අ | ම | ර | ණී | ය |

## ආදරණීය දරුවනි

"ළමා ප්‍රබෝධනය" ට
ඔබගේ ලස්සණ නිර්මාණ,
කවි, ගීත, නිසඳැස්,
කෙටිකතා, ලිපි, ආදිය ලැබීමට
අපි බොහොම කැමැත්තෙන් සිටිමු.
ඔබ එවන ඒ නිර්මාණය සමඟ
පන්තිභාර ගුරුතුමාගේ හෝ
ගුරුතුමියගේ
අත්සන ඇතිව අප වෙත එවන්න.

**සංස්කාරක පියතුමා.**
**"භක්ති ප්‍රබෝධනය"**
**265, ඩීන්ස් පාර, මරදාන,**
**කොළඹ 10.**
Email: bhakthi.prabodhanaya@gmail.com

## භක්ති ප්‍රබෝධනය ඉදිරි තේමා

**2022 ජූලි - අගෝස්තු - "විවාහය"**
**2022 සැප්තැම්බර් - "දේව දරුවෝ"**
(සැප්තැම්බර් කලාපය සඳහා ඔබ එවන ලිපි ජූලි 31 ට පෙර අප වෙත එවන්න.)

මිහිමඬලෙත්..... 23 වන පිටුවෙන්.....

පුද කරන්නේද දරු සෙනෙහස හද ගැබේ රූරා ගලන නිසාය. දරුවන්ගේ රක්ෂණය වෙනුවෙන් ඕනෑම භයංකර කටයුත්තක නියැලීමට ඇය සැමවිටම සූදානම් වන්නේ ද ඇය තුළ පවතින මාතෘ සෙනෙහස මොනවාට කියා පාමිනි. අම්මා තම දරුවන්ට යහපත් දේ පමණක්ම ලබා දෙන බවට පහත කව මගිනුත් නිරූපිතය.

ගසක දොඩම් මදැයි කියා කෑ දැයි අපෙ අම්මා
අහස තරුත් මදැයි කියා විලි ලූ දැයි අම්මා
මුහුදු දියත් මදැයි සිතා රස කිරි දුන් අම්මා
සතර අපායේ නොවැටී නිවන් දකින් අම්මා

ජීවිත ගමන ජයගන්නට දිය හැකි යහපත් දෙයම දානය කරන අම්මා වෙනුවෙන් දරුවන් ලෙස අපගේ පැතුම "සතර අපායෙහි නොවැටී නිවන් දකින් අම්මා" යන්නය අම්මා ඔබට - මට දී ඇති සැම දෙයකටම සමාජයක් ලෙස අප සැවොම අම්මා යන නාමයට සදා ණයගැති බව තරයේ සිහි තබා ගත යුත්තකි.

දරුවන්ගේ ජීවිතවලට එළඹෙන සැම කරදර බාධාවකටම පිළිතුරු සෙවීමට අම්මා යන චරිතය අපගේ ජීවිත සඳහා මනා පිටුබලයක් ලබා දෙන්නීය. දරුවන් තරම් උගත් නොවුණත් දරුවන්ට නොමැති සමාජීය දැනුම තුළින් ඇය ඇගේ දරු කැල රක්ෂා කරන්නේ කිරිල්ලියක තම පැටවුන් රක්නා ලෙසය. "අම්මා" යන උතුම් අක්ෂර ත්‍රිත්ව යන නාමයට සමාජය තුළ තව තවත් ඉහළින් ගරු බුහුමන් පිදීමට පෙළඹවිය යුතුය. තම දෙමාපියන්ව මහමඟට නොව තම නිවෙස්වලම ආරක්ෂා කරලීමට දරුවන්ගේ සිත්සතන් පහන් කළ යුතුය.එසේ වූ විට මෙය මුළුමහත් සමාජයම ගුණ නැණින් පිරිපුන් වූ ආදරය, කරුණාව, උතුරා යන සමාජයක් නොවන බවට නොඅනුමානය.

මිහි මඩලේ අඳුරු කුසේ දිය උල්පත අම්මා
අහස් තලෙන් මරු කතරට වහින වැස්ස අම්මා
නිල් දෙරණේ තුරුලිය මත මල් සම්පත අම්මා
තුරුලිය මත පිපි කුසුමේ පල සම්පත අම්මා

මොනවද අම්මේ..... 29 වන පිටුවෙන්.....

සොබාදහම ගැන විමසිලිමත්ව බලලා ප්‍රශ්න අහනවද ?

"මොනවද අම්මේ අකුරු ජාතියක් මල් පෙතිවල කවුදෝ ලියලා..."

"පුතා දන්නේ නෑ හඳ ඇති කාලෙට වනන්තරේ හරි වැඩ කෙරෙති..."

අම්මාලා තාත්තලා කී දෙනෙක් දරුවන් අහන ප්‍රශ්න වලට උත්තර දෙනවද? එහෙම නැතිනම් නැවත ප්‍රශ්න නොඅසන්න වචනයකින් හෝ තම ඉරියව්වලින් දරුවන්ව අධෛර්ය කරනවාද? නැත්තම් සාධාරණ පිළිතුරු දෙන්නට වෙහෙසෙනවාද?

දරුවන්ව හදනවා යනු කන්ඩ, බොන්ඩ, අඳින්නට, පළඳින්නට, පාසැලට සහ උපකාරක පන්තිවලට යවනවාට වඩා එහා ලෝකයක් තිබෙන බව බොහෝ අම්මාවරුන්ට අමතක වී ඇත

පරිසරයේ වර්ණවත්බව, විචිත්‍රතත්වය, ආකර්ෂණීයත්වය පමණක් නොව බුදුන් වහන්සේ පිළිබඳව පුංචි පාඩමක් ළමා මනසට ගැලපෙන ලෙස පුතාට තම දහම ප්‍රථමයෙන්ම කියා දෙන්නේ අම්මාය.

මේ ගීතයෙන් පෙන්වන ආකාරයට පුතාගේ නිර්මාණාත්මක හැකියාව අම්මා මොට නොකර තම මව් පදවිය කෙරෙහි දරුවාගේ විශ්වාසය ගෞරවය ගොඩ නඟන අයුරු ඉතා කදිමට ගීත රචකයා මතු කරන්නේ සියලු අම්මාවරුන්ට පමණක් නොව අනාගතයේ මව්පදවිය ලබන්නට පෙරුම්පුරන දියණියන්ට, පියවරුන් ඇතුළු වැඩිහිටි සැමට දරුවන්ගේ අනාගතය ගෙන යා යුතු දිශාන්තය පෙන්වා දෙමින්ය.

මෙවන් කතාන්තර ගීත ආකාරයෙන් රසවිඳින්න අපේ පුංචි දරුවන්ට අවස්ථාව සලස්වන මැණිවරුන් සැබෑ විචක්ෂණයෙන් හෙවත් දුර දක්නා නුවණින් ක්‍රියාකරන ආකාරය ප්‍රශංසනීයය.

# අම්මා

අම්මා යන අකුරු තුනේ
මහ බලයක් ගතට දැනේ
හැම දෙනාට පාන සෙනේ
දෙවියොත් මව වදිනු පෙනේ

අම්මා කියන වචනය දිනකට අපට
කී වාරයක් දවසට ඇසුණද කනට
කුලමල ජාති ආගම් අදහන අයට
අම්මා කියන වචනය මිහිරිද කනට

අම්මේ කව්ද අම්මා යන නම යෙදුවේ
අම්මා තමයි ලොවටම දරුවන් තැනුවේ
හඳුනා ගන්න හැම කෙනකුට නම යෙදුවේ
අම්මා තමයි හැම කෙනකුට කිරි පෙව්වේ

අම්මෙක් තමයි මුළු පවුලෙම බර ගත්තු
දරුවන් දරුමුනුපුරන් තම තුරුලට ගත්තු
මරුවන් නොකර දරුවන් යහමඟ ගත්තු
අම්මාවරු සිටිති ලෝකෙම ජය ගත්තු

අම්මා කියන නම වෙන කෙනකුට පවසන්න
අම්මට මිසක බැහැ කෙනකුට පළඳින්න
අම්මේ ඔබේ මව් පදවිය රැකගන්න
මව් පදවියට කිසිම වරදක් නොකරන්න

(මිය යාමට දෙදිනකට පෙර මැයි කලාපයට ලියන ලද කවි පෙලයි...)

**බෙනඩික්ට් විජේසිංහ**
කඩවත

ඉතා රසවත්, නැණවත් සමාජ කාරණා මතුකරමින් භක්ති ප්‍රබෝධනයට අනර්ඝ කාව්‍ය නිර්මාණ ඉදිරිපත් කළ කඩවත විසූ බෙනඩික්ට් විජේසිංහ දයාබර පියාණන් 2022 අප්‍රේල් 9 දා අප අතරින් සදහටම සමුගත්තේය. පවුලේ සැමට සාතිශය සංවේගය පතමින් භක්ති ප්‍රබෝධිහන ලේඛක, පාඨක සැම සමග එක්ව එතුමාට සග සුව යදිමු.


ප්‍රේමයේ පවතින්නට
JESUS TODAY

Jesustoday.kl සති අග වෙබ් සංග්‍රහය

ශ්‍රී ලංකාවේ කිතුනු සන්නිවේදන ඉතිහාසයේ
සුවිශේෂි මං ලකුණක් සටහන් කරමින්
ශ්‍රී ලංකාවේ සතිපතා යාවත්කාලීන වන
එකම කිතුනු වෙබ් සංග්‍රහය වන
www.jesustoday.lk
2022 පසුගිය මාර්තු මස
පළමු සතියට
වර්ෂ පහක්
සම්පූර්ණ
කරයි.

කිතු දහමේ සැබෑ විමුක්ති සාරය
මතු කොට දැක්වෙන
ළමා, නව යොවුන්, තරුණ, ස්ත්‍රී
දේව ධර්මයක් ප්‍රවර්ධනය කරන
අතරම කාලීන සමාජ ආර්ථික, පාරිසරික, දේශපාලනික සංසිද්ධීන්
කිතු නෙතින් බලා විග්‍රහ කරන පුවත්, පුවත් විශේෂාංග මෙහි ඇතුළත් වේ.
ඊට අමතරව ලොව පුරා දිවැසිවර සාක්ෂි දරන්නන් පිළිබඳ
ජීවිත සාක්ෂිද, කිතුනු විචාර විධික්‍රමයක් ඔස්සේ
කිතුනු සාහිත්‍ය හා කලා නිර්මාණ පිළිබඳ කෙරෙන විවරණයක්ද
විශේෂයෙන් ප්‍රැන්සිස් ශුද්ධොත්තම පියතුමාගේ
විශ්ව ලේඛන, අපොස්තලික අනුශාසනා ආදිය පිළිබඳ පුළුල් විමසීමක් සහිත ලිපි ද
මේ වෙබ් සංග්‍රහයට තුළ අන්තර්ගතය.
මෙහි පළවන ඉරුදින සුපුවත ඇතුළු මෙනෙහි කිරීම්
දෛනික කිතුනු ජීවිත අර්ථවත් කර ගැනීමට අත්වැළකි.

leads
Where Children Come First...

LEADS යනු 1983 දී පිහිටුවන ලද ජාතික ආයතනයක් වන අතර ශ්‍රී ලංකාවේ දරුවන්ට සුරක්ෂිත අවකාශයක් සහ දීප්තිමත් අනාගතයක් නිර්මාණය කිරීමට කැප වූ රාජ්‍ය නොවන අනුමත ආයතනයකි.





# අපගේ පුහුණු වැඩසටහන් සහ දැනුවත්කිරීම්

"ඉගෙනීම අහම්බෙන් ලැබෙන දෙයක් නොවේ. එය උනන්දුවෙන් සෙවිය යුතු අතර උත්සාහයෙන් සහභාගි විය යුතුය."
- ඇබිගේල් ඇඩම්ස් -

"වෙනසක් සඳහා පළමු පියවර වන්නේ දැනුවත් කිරීමයි. දෙවන පියවර වන්නේ එය පිළිගැනීමයි."
- නතානියෙල් බ්‍රැන්ඩන් -

## පුහුණු වැඩසටහන්

- ළමා ආරක්ෂාව සම්බන්ධව තෙදින පුහුණුව

  **පුහුණුව තුල ආවරණය කරන මාතෘකාවන්**

  - ශ්‍රී ලංකාව තුල ළමා ලිංගික අපයෝජනය පිළිබඳ යථාර්ථය හා අපගේ වගකීම.
  - ළමා ලිංගික අපයෝජනයෙන් ළමයාට හා පවුලට ඇතිවන බලපෑම්.
  - ළමා ලිංගික අපයෝජනාත්මක සිදුවීමක් අනාවරණය වූ අවස්ථාවකදී ක්‍රියා කලයුතු ආකාරය.
  - ළමා අපයෝජනය හා බැඳුණු ශ්‍රී ලාංකීය නීතිය.
- ළමුන් හසුරුවා ගැනීම සඳහා ධනාත්මක කුසලතා සංවර්ධනය දෙදින පුහුණුව

  **පුහුණුව තුල ආවරණය කරන මාතෘකාවන්**

  - ධනාත්මක ආකල්ප හඳුනා ගැනීම.
  - සන්නිවේදන කුසලතා සංවර්ධනය.
  - සවන්දීමේ කුසලතා සංවර්ධනය.
  - කෝපය කළමණාකරණය.
  - ගැටළු විසඳීමේ මූලධර්ම.
  - යහපත් දෙමාපියභාවය.
  - ධනාත්මක ශික්ෂණය.
- ළමා අයිතිවාසිකම්

## දැනුවත්කිරීම්

- ලිංගික අපයෝජනයෙන් ආරක්ෂා වීමට වයසානුකූලව ළමුන් දැනුවත් කිරීම. (3 - 6, 7 - 12, 13 - 18 )
- ළමා ආරක්ෂාව සම්බන්ධව දෙමව්පියන් දැනුවත් කිරීම.
- ළමුන් සවිබලගැන්වීම.
- ළමා අයිතිවාසිකම්.
- ළමුන්ව අන්තර්ජාලය තුළ සුරක්ෂිත කිරීම. (ළමුන් සහ දෙමාපියන් )

**වැඩි විස්තර සඳහා අමතන්න 077 395 73 49 - 077 318 79 55**

25, Hospital Road
Dehiwela, 10350
Sri Lanka.

www.leads.lk
russell@leads.lk
Tel: +94 77 318 79 55

@LEADSmakingadifference
@LEADSSriLanka
@LEADSSriLanka




මිල රු.100/=
(සහන මිල)

"භක්ති ප්‍රබෝධනය" සංස්කාරක ගරු එමාඩ් දල්පතාදු නි.ම.නි. පියතුමා විසින් කොළඹ කතෝලික මුද්‍රණාලයේ මුද්‍රණය කරන ලදී. පුවත් පතක් ලෙස තැපැල් හලේ ලියාපදිංචි කර ඇත. QD/NEWS/09/2022